3

# ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්

## 3.1 සමස්ත නිරීක්ෂණ

දැනටත් අභියෝග එල්ල කරමින් පවතින කොවිඩ්-19 වසංගතය මගින් 2020 වසරේ දී ඇති කරන ලද වෙනස් සහ බහුවිධ මුහුණුවරකින් යුතු අභියෝගතා හමුවේ, සේවා සැපයීම සහ සංවර්ධන කටයුතු යන දෙ අංශයෙන්ම රටේ ආර්ථික හා සමාජ යටිතල පහසුකම් පසුබෑමකට ලක් විය. කෙසේ වෙතත්, මෙම සුවිශේෂී අභියෝගාත්මක කාලපරිච්ඡේදය තුළ, රටෙහි පවතින ශක්තිමත් යටිතල පහසුකම් පද්ධතිය ස්වාරක්ෂකයක් ලෙස කටයුතු කළ අතර, ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යෑමට සහාය සැපයුවේය. 2020 වසරේ මාර්තු මස මැද සිට අප්‍රේල් අවසානය දක්වා කාලය තුළ රට පුරා සංචරණ සීමා පැනවීමත් සමග මුළුමනින්ම අඩාල වූ දේශීය ප්‍රවාහන කටයුතු, එයින් අනතුරුව ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වූ ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීම් හේතුවෙන් ඇතැම් අවස්ථාවල දී පසුබෑම්වලට ලක් වුවද, ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය. මෙරට ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් 2020 මාර්තු මාසයේ මැද භාගයේ සිට වසර පුරා සංචාරකයින් සඳහා වසා දමා තිබුණි. ගෝලීය සැපයුම් දාමයන්ට ඇති වූ අවහිරතා සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ කොවිඩ්-19 වැළඳුණු රෝගීන් කිහිප දෙනෙකු හඳුනා ගැනීම වසර තුළ දී වරාය අංශයේ ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපෑවේය. සංචරණ සීමා, පුද්ගල දුරස්ථභාවය පවත්වා ගැනීමේ අවශ්‍යතාව සහ කොවිඩ්-19 ආශ්‍රිත අනෙකුත් සෞඛ්‍ය නියාමනයන් හේතුවෙන් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්ම ක්‍රියාත්මක වූයේ මන්දගාමී ආකාරයට ය. වසරේ දෙවන කාර්තුව තුළ දී දීපව්‍යාප්තව ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීමට පියවර ගැනීම හේතුවෙන් බලශක්ති සඳහා ඉල්ලුම සැලකිය යුතු ලෙස පහළ ගිය අතර, ඉන්පසුව එය වසංගත කාලපරිච්ඡේදයට පෙර පැවති මට්ටමට ක්‍රමයෙන් ළඟා විය. කොවිඩ්-19 වසංගතය මගින් ඇති කළ බාධා මධ්‍යයේ වුව ද, ආර්ථිකයේ වර්ධන ප්‍රවණතා එම බාධාවලට ඔරොත්තු දෙන පරිදි පවත්වා ගත හැකි වූයේ පසුගිය දශක කිහිපය තුළ සමාජ ආර්ථික යටිතල පහසුකම් සඳහා සිදු කරන ලද අඛණ්ඩ ආයෝජන හේතුවෙනි. කොවිඩ්-19 වසංගතය මගින් නිර්මාණය කරන ලද අභියෝගයන්ට පූර්වෝපායිකව අනුගත වෙමින්, ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබූ කාල සීමාව තුළ බාධාවකින් තොර අතථ්‍ය සම්බන්ධතාවක් පවත්වා ගැනීම සහතික කිරීමට කටයුතු කළ විදුලි සංදේශ අංශය විසින් කොවිඩ්-19 හා සබැඳි සීමා මධ්‍යයේ ආර්ථික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා විශාල සහයෝගයක් ලබා දෙන ලදී. අධ්‍යාපනික සහ කාර්යාලයීය කටයුතු සඳහා මෙන්ම, වසංගත කාලපරිච්ඡේදය තුළ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමට අනුගමනය කළ පියවර මධ්‍යයේ සමාජ සම්බන්ධතා පවත්වා ගැනීම සහතික කිරීම සඳහා තරගකාරී මිල ගණන් යටතේ පිරිවැය කාර්යක්ෂම දත්ත විසඳුම් ලබා දීම ඉලක්ක කරගත් නව පැකේජ කිහිපයක් විදුලි සංදේශ ජාල සපයන්නන් විසින් වසර මුළුල්ලේම සපයන ලදී. මේ අතර, අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවයෙන් යුතුව සෞඛ්‍ය ක්ෂේත්‍රය විසින් සිදු කරන ලද පූර්වෝපායික හා සාර්ථක සේවා සැපයුම හේතුවෙන් වෛරසය පැතිරීම පාලනය කිරීමටත්, අඩු මරණ අනුපාතයක් පවත්වා ගැනීමටත්, ආර්ථික ක්‍රියාකාරකම් සාපේක්ෂ වශයෙන් වේගවත්ව යථා තත්ත්වයට පත් කිරීමටත් හැකි විය. කෙසේ වෙතත්, බෝනොවන රෝග ගැටලුව හමුවේ මුහුණ දෙන පීඩනය තවදුරටත් පැවති අතර, කොවිඩ්-19 ආශ්‍රිත අවහිරතා මධ්‍යයේ වුව ද, එවැනි රෝගවලින් පීඩා විඳින රෝගීන්ට අඛණ්ඩව වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සහතික කිරීම සඳහා සෞඛ්‍ය අංශය විසින් පියවර රැසක් ක්‍රියාත්මක

*කරන ලදී. පාසල් සහ විශ්වවිද්‍යාල වරින් වර වසා දැමීම හමුවේ, සම්ප්‍රේෂණ පහසුකම් නොමැති දුර බැහැර ප්‍රදේශවල හැර අනෙකුත් ප්‍රදේශවල අධ්‍යාපන කටයුතු ඩිජිටල් පන්ති කාමර හරහා අඛණ්ඩව සිදු කෙරිණි. 2020 අධ්‍යයන වර්ෂය සඳහා නියමිත ජාතික විභාග පැවැත්වීම ප්‍රමාද වුව ද, ඒවා සාර්ථකව පැවැත්විණි. කොවිඩ්-19 වසංගතය මගින් ජනගහනයේ අඩු ආදායම්ලාභීන් හට විෂමාකාර ඉහළ බලපෑමක් ඇති වීම සැලකිල්ලට ගනිමින්, අවදානමට ලක් විය හැකි පවුල් සහ පුද්ගලයින්ට සිය දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට සහාය දීම සඳහා, රජය විසින් දීමනාවක් ගෙවීමට සහ වෙනත් සහන ක්‍රියාමාර්ග සැලසීමට පියවර ගන්නා ලදී. කෙසේ වෙතත්, දරිද්‍රතාවය දුරු කිරීම ඉලක්ක කර ගත් ක්‍රියාමාර්ග හා සම්බන්ධව පවතින ගැටලු, රජයේ මෙබඳු අධික පිරිවැයක් සහිත මැදිහත්වීම්වල සඵලතාව කෙරෙහි දිගින් දිගටම අහිතකර ලෙස බලපෑම් එල්ල කරයි. 2020 වසර තුළ දී දක්නට ලැබුණු පරිදි, සමාජ ආර්ථික යටිතල පහසුකම්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා නොකඩවා සිදු කෙරෙන ආයෝජන, ආර්ථික කටයුතුවල ඔරොත්තු දීමේ හැකියාව සහ අඛණ්ඩතාව තහවුරු කිරීම මගින් සාර්ව ආර්ථිකයට ද, දැනට පවතින සමාජ ආර්ථික විෂමතා පුළුල් වීම වැළැක්වීම හරහා සූක්ෂම ආර්ථිකයට ද ස්වාරක්ෂකයක් ලෙස කටයුතු කරනු ඇත. ආර්ථික කම්පනවල වෙනස්වන ස්වභාවය සහ තීව්‍ර බව සැලකිල්ලට ගත් කළ, එමගින් මතු වන අහිතකර ආර්ථික ප්‍රතිඵල සීමා කිරීමට සහ මැදි කාලීන වර්ධන ක්‍රියාවලියේ තිරසාර මෙන්ම සාර්වසහභාගී බව සහතික කිරීමට ශක්තිමත් යටිතල පහසුකම් පදනමකට හැකි වේ.*


3

## 3.2. ආර්ථික යටිතල පහසුකම් ප්‍රතිපත්ති, ආයතනික රාමුව සහ ක්‍රියාකාරිත්වය

### ඛනිජ තෙල්

**කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වසරේ මාර්තු මාසයේ දී ගෝලීය බොරතෙල් මිල ගණන් අනපේක්ෂිත ලෙස පහත වැටුණු අතර, වසර අවසානය වන විට මිල ගණන් ශීඝ්‍රයෙන් යථා තත්ත්වයට පත් විය.** බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය පසුගිය වසරේ පැවති එ.ජ. ඩොලර් 64.04ක සිට 2020 වසරේ දී එ.ජ. ඩොලර් 43.35ක් දක්වා සියයට 32.3කින් පහළ ගියේය. කෙසේ වෙතත්, වසර පුරා බොරතෙල් මිල ගණන් සැලකිය යුතු මට්ටමක ඉහළ විචලනයක් පෙන්නුම් කළේය. වසර ආරම්භයේ දී භූ දේශපාලනික ගැටුම් හේතුවෙන් ඉහළ ගිය බොරතෙල් මිල ගණන්, කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමග තියුණු ලෙස පහත වැටුණි. 2000 වසරේ සිට මේ දක්වා වාර්තා වූ බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක අඩුම මිල 2020 අප්‍රේල් මැද භාගයේ දී වාර්තා විය. ඉල්ලුම දුර්වල වීම සහ ගබඩා ධාරිතාව ප්‍රමාණවත් නොවීම මධ්‍යයේ වුව ද නිෂ්පාදනය අඛණ්ඩව සිදු කිරීම හේතුවෙන්, 2020 අප්‍රේල් මාසයේ දී බැරලයක මිල එ.ජ. ඩොලර් සෘණ 37.63ක අගයක් වාර්තා කරමින් වෙස්ට් ටෙක්සාස් ඉන්ටමීඩියට් (ඩබ්.ටී.අයි.) මිල ගණන් ඉතිහාසයේ ප්‍රථම වතාවට සෘණ අගයක් දක්වා පහත වැටිණි. ඉල්ලුම සම්බන්ධයෙන් සැලකීමේ දී, වසංගත තත්ත්වය හේතු කොටගෙන ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීම් සහ සංචරණ සීමා පැනවීම් මිල ගණන් මත සෘණාත්මක බලපෑමක් ඇති කළ අතර, සැපයුම් සම්බන්ධයෙන් සැලකීමේ දී, මිල ඉහළ නැංවීම සඳහා ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය (ඔපෙක්) විසින් වසර පුරා කිහිප වරක් සැපයුම් කප්පාදු සිදු කරන ලදී. කෙසේ වෙතත්, සුභවාදී ආර්ථික අපේක්ෂා සමග 2020 වසරේ නොවැම්බර් මාසයේ සිට ගෝලීය බොරතෙල් මිල ගණන්වල ඉහළ යෑමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි. ඒ අනුව, වසර අවසානය වන විට බොරතෙල් බැරලයක දෛනික මිල එ.ජ.ඩොලර් 51.34ක් දක්වා ඉහළ ගියේය. ගෝලීය බොරතෙල් මිල ප්‍රවණතාවන්ට අනුකූලව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.සං.) විසින් ආනයනය කරන ලද බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය,

**3.1 රූප සටහන**
**ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් (බ්‍රෙන්ට්) සාමාන්‍ය මිල සහ ලං.ඛ.නී.සං. බොරතෙල් ආනයන මිල**





මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව


## 3.2 රූප සටහන
## ආර්ථික හා සමාජ යටිතල පහසුකම්වල ක්‍රියාකාරිත්වය

පසුගිය දශක කිහිපය පුරා රටේ සමාජ ආර්ථික යටිතල පහසුකම් සඳහා වූ නිරන්තර රාජ්‍ය ආයෝජන, ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යාමට පහසුකම් සැලසූ අතර, එමගින් කොවිඩ්-19 වසංගතය තුළින් ඇති කරන ලද අහිතකර ආර්ථික ප්‍රතිඵල අවම කිරීමට හැකි විය.


කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ප්‍රවාහන කටයුතු අඩාල වුව ද, වසර අවසානයේ දී එය යළි යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළේය.





### ප්‍රවාහන අංශය වෙත පෙට්‍රල් සහ ඩීසල් අලෙවි කළ ප්‍රමාණය (මෙ.ටො.දහස්)




වරාය සේවා කටයුතු ද වසර තුළ දී සැලකිය යුතු පසුබෑමකට ලක් විය.




**ආර්ථික වර්ධන ක්‍රියාකාරිත්වය දැඩි බලපෑමකට ලක්නොවන පරිදි පවත්වා ගැනීම සඳහා විදුලි සංදේශ අංශය මගින් ඉහළ දායකත්වයක් සැපයිණි.**

### විදුලි සංදේශ අංශය
(පුද්ගලයින් 100කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව)

11.9

131.1

79.9

### අධ්‍යාපන කටයුතු අඛණ්ඩව සිදු කිරීම සඳහා ගත් නව ප්‍රයත්න

**නව ඉගෙනුම් ක්‍රම වෙත අනුගත වීම**

මිශ්‍ර ඉගෙනුම් ක්‍රම
- ඊ-තක්සලාව
- ගුරු ගෙදර
- කාර්ය සටහන් පත්‍ර
- ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය
  - සූම් තාක්ෂණ සැසි 502,000
  - මිලියන 22.3ක අන්තර්ජාල සහභාගීත්වය

**අඛණ්ඩව අධ්‍යාපන කටයුතු සිදු කිරීමේ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම**


- අධ්‍යාපන අමාත්‍යාංශයේ හදිසි තත්ත්ව සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලසුම (CERP)
- ප්‍රමාද වීම් මධ්‍යයේ වුවත් සියලුම ජාතික මට්ටමේ විභාග පැවැත්වීම
- ගුරුවරුන්ගේ මංගත ක්‍රම හරහා ඉගැන්වීමේ හැකියාව වැඩි දියුණු කිරීම
- තාක්ෂණික පහසුකම් වෙත ප්‍රවේශ වීමේ දී ඇති වන ගැටලු විසඳීම

22.2% — ඩෙස්ක්ටොප් පරිගණක හෝ ලැප්ටොප් පරිගණක සහිත ගෘහ ඒකක

32.0% — පරිගණක සාක්ෂරතාව

විදුලිබල උත්පාදනයෙහි සුළු පහළ යෑමක් වාර්තා විය.

### විදුලිබල උත්පාදනය (ගි.වො.පැ.)




### ප්‍රධාන අංශ සඳහා විදුලිබල අලෙවියේ ක්‍රියාකාරිත්වය

| | ගෘහස්ථ සහ ආගමික | කර්මාන්ත | පොදු සේවා සහ හෝටල් | සමස්ත |
|---|---|---|---|---|
| | 6.4% | -5.2% | -9.1% | -2.2% |
| 2019 | 4,863 | 4,392 | 3,563 | 14,611 |
| 2020 | 5,172 | 4,164 | 3,238 | 14,287 |

**සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්යක්ෂම සේවය මගින් වෛරසය පැතිරීම මැඩ පැවැත්වීමට, අඩු මරණ අනුපාතයක් පවත්වා ගැනීමට සහ ආර්ථික ක්‍රියාකාරකම් සාපේක්ෂව වේගයෙන් යථා තත්ත්වයට පත් කිරීමට හැකි විය.**

**රාජ්‍ය අංශය**

| වෛද්‍යවරුන් සංඛ්‍යාව (එක් වෛද්‍යවරයෙකු සඳහා පුද්ගලයන් සංඛ්‍යාව) | හෙද නිලධාරීන් සංඛ්‍යාව (එක් හෙද නිලධාරියෙකු සඳහා පුද්ගලයන් සංඛ්‍යාව) | ඇඳන් සංඛ්‍යාව (පුද්ගලයන් දහසකට) |
|---|---|---|
| 1,117 | 582 | 3.5 |

**ආයුර්වේද වෛද්‍ය අංශය**

| ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව | රෝහල් සංඛ්‍යාව | ඇඳන් සංඛ්‍යාව |
|---|---|---|
| 26,061 | 118 | 5,058 |

**පෞද්ගලික අංශය**

| රෝහල් සංඛ්‍යාව | ඇඳන් සංඛ්‍යාව |
|---|---|
| 217 | 5,173 |

**3.1 සංඛ්‍යා සටහන**

**දේශීය ඛනිජ තෙල් මිල සංශෝධන**

| | අවසන් සංශෝධන දිනය | 2020 වසර අවසානය වන විට මිල (ලීටරයකට රුපියල්) |
|---|---|---|
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | | |
| පෙට්‍රල් 92 | 2019.09.11 | 137.00 |
| පෙට්‍රල් 95 | 2019.09.11 | 161.00 |
| ඔටෝ ඩීසල් | 2019.03.13 | 104.00 |
| භූමිතෙල් | 2018.06.13 | 70.00 |
| ලංකා අයිඕසී පොදු සීමිත සමාගම | | |
| පෙට්‍රල් 92 | 2020.05.23 | 137.00 |
| පෙට්‍රල් 95 | 2019.09.11 | 164.00 |
| ඔටෝ ඩීසල් | 2019.05.14 | 104.00 |

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම

3


2019 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් 68.80ට සාපේක්ෂව 2020 වසරේ දී එ.ජ. ඩොලර් 45.57ක් දක්වා පහළ ගියේය. 2021 වසරේ පළමු කාර්තුව තුළ දී ද, බොරතෙල් මිල ගණන් දෛනික වශයෙන් විචලනයක් පෙන්නුම් කළ අතර, කොවිඩ්-19 එන්නත සම්බන්ධයෙන් වූ බෙදාහැරීම්, සැපයුම් හා සෞඛ්‍ය ගැටලු, කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව ඉහළ යෑම හා නව වෛරස ප්‍රභේද හමුවේ ආර්ථික හා සමාජ කටයුතු සඳහා අලුතින් සීමා පැනවීම්, ආර්ථිකයන් යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජයයන් විසින් අඛණ්ඩව කටයුතු කිරීම සහ ඔපෙක් සංවිධානයේ සැපයුම් කප්පාදු මෙන්ම, සූවස් ඇළ මාර්ගයේ තාවකාලිකව මතු වූ අවහිරය යනාදී සාධක හේතුවෙන් වෙළඳපොළ තුළ බොරතෙල් බැරලයක මිල එ.ජ. ඩොලර් 60-70ත් අතර පරාසයක බොහෝ දුරට රැඳී පැවතුණි. 2021 පළමු කාර්තුවේ පැවති බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල එ.ජ. ඩොලර් 61.22කි.

**2019 සැප්තැම්බර් මස සිදු කරන ලද මිල සංශෝධනවලින් අනතුරුව, ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය සිල්ලර මිල ගණන්වල කිසිදු සංශෝධනයක් සිදු නොවීය.** කෙසේ වුවත්, තාප විදුලිබල උත්පාදනය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) වෙත යම් සහනයක් ලබා දීමේ අරමුණින්, 2020 වසර තුළ දී දැවි තෙල් 800 සහ දැවි තෙල් 1,500 ලීටරයක මිල රුපියල් 70.00ක් දක්වා රුපියල් 26.00කින් අඩු කරන ලදී. මෙම සහනය පසුව ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින් වෙත ද ලබා දෙන ලදී. මේ අතර, ලංකා අයිඕසී පොදු සීමිත සමාගම (LIOC) 2020 මුල් භාගයේ දී දේශීය සිල්ලර මිල තෙවරක් සංශෝධනය කළේය.

**අසාමාන්‍ය ලෙස ජාත්‍යන්තර වෙළඳපොළේ පහළ ගිය තෙල් මිලෙහි ප්‍රතිලාභ ආර්ථිකය පුරා සාධාරණ ලෙස බෙදා හැරීම සහතික කිරීම සඳහා දේශීය ඉන්ධන මිල ගණන් සංශෝධනය කිරීම වෙනුවට 2020 මාර්තු මාසයේදී ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල පිහිටුවන ලදී.** 2020 මාර්තු මාසයේ දී එම අරමුදල ස්ථාපිත කරන විට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් රුපියල් බිලියන 47.5ක අරමුදල් රැස් කර ගන්නා ලදී. 2020 අප්‍රේල් මාසය අවසානයේ සිට පෙට්‍රල්, සුපිරි ඩීසල් සහ සුදු ඩීසල් ආනයනය සඳහා ඉන්ධන අධිභාර පැනවූ අතර, අධිභාර හරහා රැස් කරන ලද අරමුදල් ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල වෙත යොමු කරන ලදී. කෙසේ වෙතත්, පෙට්‍රල් 92 ආනයනය සඳහා වන අධිභාරය 2020 ජුනි මාසයේ දී ඉවත් කරන ලද අතර, පෙට්‍රල් 95, සුදු ඩීසල් සහ සුපිරි ඩීසල් සඳහා වන අධිභාරය පහළ හෙළමින් සංශෝධනය කරන ලදී. පසුව, ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය කිරීම සඳහා පැවති සියලුම අධිභාර 2021 පෙබරවාරි සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලබාගත් අරමුදල් ද ඇතුළුව, 2020 වසර තුළ දී දළ වශයෙන් රුපියල් බිලියන 69.2ක මුදලක් ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලෙහි එකතු වූ අතර, එයින් රුපියල් බිලියන 48.0ක් ලං.වි.ම. වෙතින් ලං.ඛ.නී.සං.ට ලැබිය යුතු හිඟ මුදල් අර්ධ වශයෙන් පියවීම සඳහා යොදාගෙන ඇති අතර, දළ වශයෙන් රුපියල් බිලියන 21.0ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කෙරුණු භාණ්ඩාගාර බිල්පත් පියවීම සඳහා යොදා ගැනුණි.

**විශේෂයෙන්ම වසරේ දෙවන කාර්තුවේ දී, කොවිඩ්-19 ව්‍යාප්තිය මගින් ඇති කරන ලද අවහිරතා හේතුවෙන් මන්දගාමී වූ ආර්ථික ක්‍රියාකාරකම් හා සංචරණ සීමාවල බලපෑම පිළිබිඹු කරමින්, වසර තුළ දී දේශීය වෙළඳපොළ තුළ ඛනිජ තෙල් නිෂ්පාදිත අලෙවිය සියයට 16.8කින් පහළ ගියේය.** ඒ අනුව, ලං.ඛ.නී.සං.හි සහ ලංකා අයිඕසී පොදු සීමිත සමාගමේ විකුණුම් පරිමා, පිළිවෙළින්, සියයට 16.9කින් සහ සියයට 15.7කින් අඩු විය. දේශීය වෙළඳපොළ තුළ ඛනිජ තෙල් නිෂ්පාදිත අලෙවියෙහි සමස්ත පහළ යෑමට සමගාමීව, ලං.ඛ.නී.සං. මගින් ප්‍රවාහන අංශය වෙත අලෙවි කළ ප්‍රමාණය 2020 වසර තුළ දී සමස්තයක් වශයෙන් සියයට 13.6කින් පහළ ගියේය. මේ අතර, විදුලිබල උත්පාදන සංයුතිය තුළ තාප විදුලිබල උත්පාදනයේ දායකත්වය පහළ යෑමත් සමඟ, විදුලිබල උත්පාදනය සඳහා වූ ඩීසල් අලෙවිය 2020 වසර තුළ දී සැලකිය යුතු ලෙස සියයට 61.0ක පහළ

**3.3 රූප සටහන**
**ප්‍රවාහන අංශය සඳහා පෙට්‍රල් සහ ඩීසල් අලෙවිය**




මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම

යැමක් වාර්තා කළ අතර, තාප විදුලිබල උත්පාදනය සඳහා දැවි තෙල් අලෙවිය සියයට 8.9කින් පමණ ඉහළ ගියේය. තවද, කර්මාන්ත හා ගුවන් සේවා අංශවල කටයුතු කෙරෙහි කොවිඩ්-19 ව්‍යාප්තිය මගින් ඇති කළ අහිතකර බලපෑම හේතුවෙන් 2020 වසර තුළ දී මෙම අංශ සඳහා සිදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත අලෙවිය පහළ ගියේය.

**2020 වසර තුළ ලං.ඛ.නී.සං.හි පිරිපහදු නිෂ්පාදිතය සමස්තයක් ලෙස සියයට 7.7කින් පහත වැටුණි.** සමස්ත බොරතෙල් යෙදවුම් ප්‍රමාණය සියයට 9.6කින් පහළ ගිය අතර, ඩීසල් සහ පෙට්‍රල් පිරිපහදු නිෂ්පාදනය, පිළිවෙළින්, සියයට 13.9කින් සහ සියයට 11.6කින් පහළ ගියේය. කොවිඩ්-19 ආශ්‍රිත සංචරණ සීමා හේතුවෙන් දේශීය වශයෙන් ඉන්ධන සඳහා වන ඉල්ලුම පහළ යෑම පිළිබිඹු කරමින්, ලං.ඛ.නී.සං. විසින් ආනයනය කරනු ලැබූ පිරිපහදු කළ නිෂ්පාදන ධාරිතාවය ද වසර තුළ දී සියයට 22.0කින් පහළ ගියේය.

**ගෝලීය තෙල් මිල සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවතිය ද, ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් නොවෙනස්ව පවත්වා ගෙන යෑම හේතුවෙන් ලං.ඛ.නී.සං.හි මූල්‍ය ක්‍රියාකාරීත්වය 2020 වසරේ දී වර්ධනය විය.** විගණනය නොකළ තාවකාලික මූල්‍ය ඇස්තමේන්තුවලට අනුව, ලං.ඛ.නී.සං.හි පසුගිය වසරේ පැවති රුපියල් බිලියන 19.1ක මෙහෙයුම් අලාභය හා සැසඳීමේ දී 2020 වසරේ දී රුපියල් බිලියන 33.9ක මෙහෙයුම් ලාභයක් වාර්තා විය. ප්‍රවාහනය, විදුලිබල උත්පාදනය, ගුවන් සේවා

**3.2 සංඛ්‍යා සටහන**
**ඛනිජ තෙල් අංශයේ ක්‍රියාකාරීත්වය**

| ශීර්ෂය | | 2019(අ) | 2020(ආ) | වර්ධන අනුපාතය % 2019(අ) | වර්ධන අනුපාතය % 2020(ආ) |
|---|---|---|---|---|---|
| ආනයනය කළ ප්‍රමාණය (මෙ.ටො. '000) | | | | | |
| බොරතෙල් | | 1,842 | 1,667 | 10.0 | -9.5 |
| පිරිපහදු නිෂ්පාදිත | | 4,740 | 4,028 | -4.4 | -15.0 |
| ගල් අඟුරු | | 2,390 | 2,600 | 10.3 | 8.8 |
| එල්.පී. ගෑස් | | 430 | 437 | 4.1 | 1.7 |
| දේශීය එල්.පී. ගෑස් නිෂ්පාදනය (මෙ.ටො.'000) | | 27 | 25 | 22.2 | -6.4 |
| ආනයන වටිනාකම (මි.ර.ගැ.) | | | | | |
| බොරතෙල් | (රු.මිලියන) | 173,547 | 107,665 | 8.5 | -38.0 |
| | (එ.ජ.ඩො. මිලියන) | 971 | 583 | -0.8 | -39.9 |
| පිරිපහදු නිෂ්පාදිත | (රු. මිලියන) | 483,462 | 321,818 | 1.7 | -33.4 |
| | (එ.ජ.ඩො. මිලියන) | 2,706 | 1,742 | -7.9 | -35.6 |
| ගල් අඟුරු | (රු.මිලියන) | 38,719 | 40,194 | -0.1 | 3.8 |
| | (එ.ජ.ඩො. මිලියන) | 215 | 217 | -9.3 | 1.3 |
| එල්. පී. ගෑස් | (රු.මිලියන) | 43,156 | 43,812 | - | 1.5 |
| | (එ.ජ.ඩො. මිලියන) | 241 | 236 | -9.1 | -2.2 |
| බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල (මි.ර.ගැ.) | | | | | |
| | (රු./බැරල්) | 12,302 | 8,415 | -1.4 | -31.6 |
| | (එ.ජ.ඩො./බැරල්) | 68.80 | 45.57 | -9.8 | -33.8 |
| ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන ප්‍රමාණය | (මෙ.ටො. '000) | 984 | 798 | -10.0 | -18.9 |
| ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන වටිනාකම | (රු.මිලියන) | 93,194 | 68,849 | -8.2 | -26.1 |
| | (එ.ජ.ඩො. මිලියන) | 521 | 374 | -16.2 | -28.3 |
| දේශීය අලෙවිය - පිරිපහදු නිෂ්පාදිත (මෙ.ටො. '000) | | 5,528 | 4,600 | 4.8 | -16.8 |
| ඉන්, පෙට්‍රල් (ඔක්ටේන් 92) (ඇ) | | 1,269 | 1,139 | 7.6 | -10.2 |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | | 158 | 120 | -16.6 | -23.6 |
| සුදු ඩීසල් (ඈ) | | 2,139 | 1,750 | 7.7 | -18.2 |
| සුපිරි ඩීසල් | | 85 | 69 | -16.3 | -18.8 |
| භූමිතෙල් | | 206 | 176 | -1.6 | -14.8 |
| දැවිතෙල් | | 1,011 | 971 | 6.6 | -4.0 |
| ගුවන්යානා ඉන්ධන | | 474 | 189 | -5.0 | -60.2 |
| නැප්තා | | 162 | 165 | 18.1 | 1.7 |
| දේශීය අලෙවිය - එල්.පී. ගෑස් (මෙ.ටො. '000) | | 466 | 473 | 7.0 | 1.5 |
| දේශීය මිල (වර්ෂය අවසානයේ දී) (රු./ලීටර) | | | | | |
| පෙට්‍රල් (ඔක්ටේන් 92) | | 137.00 | 137.00 | 9.6 | - |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | | 161.00 | 161.00 | 8.1 | - |
| සුදු ඩීසල් | | 104.00 | 104.00 | 3.0 | - |
| සුපිරි ඩීසල් | | 132.00 | 132.00 | 9.1 | - |
| භූමිතෙල් | | 70.00 | 70.00 | - | - |
| දැවිතෙල් | | | | | |
| තත්පර 800 | | 96.00 | 70.00 | 4.3 | -27.1 |
| තත්පර 1,500 | | 96.00 | 70.00 | - | -27.1 |
| එල්.පී. ගෑස් (රු./කි.ග්‍රෑම්) | | | | | |
| ලිට්‍රෝ ගෑස් | | 119.44 | 119.44 | -13.8 | - |
| ලාෆ්ස් ගෑස් | | 119.44 | 119.44 | -13.8 | - |
| ජාත්‍යන්තර බොරතෙල් මිල ගණන් (එ.ජ.ඩො./බැරල්) | | | | | |
| බ්‍රෙන්ට් | | 64.04 | 43.35 | -10.7 | -32.3 |
| ඩබ්.ටී.අයි. | | 56.96 | 39.78 | -12.4 | -30.2 |
| ලෝක ඛනිජ තෙල් සැපයුම (දිනකට බැරල් මිලියන) | | 99.7 | 91.0 | -0.6 | -8.7 |
| ලෝක ඛනිජ තෙල් ඉල්ලුම (දිනකට බැරල් මිලියන) | | 100.5 | 93.9 | 1.2 | -6.6 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) XtraPremium Euro 3 ඇතුළත්ව
(ඈ) XtraMile ඩීසල් ඇතුළත්ව

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම
ලංකා මැරින් සර්විසස් සමාගම
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම
ලාෆ්ස් ගෑස් සමාගම
ශ්‍රී ලංකා රේගුව
බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ජාත්‍යන්තර බලශක්ති ආයතනය

3


සහ කර්මාන්ත අංශවලට අලෙවි කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදනවලින් 2020 වසරේ දී මෙහෙයුම් ලාභ ඉපැයිණි. කෙසේ වෙතත්, ලං.ඛ.නී.සං. විසින් ලබාගෙන තවම නොපියවා ඇති විදේශීය මුදලින් නාමනය වූ විශාල ණය ප්‍රමාණය හේතුවෙන්, 2020 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය නිසා ඇති වූ විනිමය අනුපාත විචල්‍යතා අලාභය රුපියල් බිලියන 21.8ක් විය. එමගින් ලං.ඛ.නී.සං.හි සමස්ත ලාභයට (බදුවලට පෙර) සෘණාත්මක බලපෑමක් ඇති කරන ලද අතර, පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 11.8ක අලාභයට සාපේක්ෂව 2020 වසරේ දී, එම අගය රුපියල් බිලියන 2.4ක ලාභයක් ලෙස සටහන් විය. මේ අතර, ලං.ඛ.නී.සං. විසින් බැංකු අංශයෙන් ලබා ගත් ණය ප්‍රමාණය 2020 වසරේ දී රුපියල් බිලියන 381.8ක් දක්වා රුපියල් බිලියන 74.1කින් ඉහළ ගිය අතර, දේශීය බලපත්‍රලාභී වාණිජ බැංකුවල පැවති ලං.ඛ.නී.සං.ට අයත් තැන්පතු ප්‍රමාණය 2019 වසර අවසානයේ දී පැවති රුපියල් බිලියන 30.0ක සිට 2020 වසර අවසානය වන විට රුපියල් බිලියන 63.9ක් දක්වා වර්ධනය විය. වසර තුළ දී ලං.වි.ම. විසින් අර්ධ වශයෙන් සිය ණය වගකීම් ගෙවීම හේතුවෙන් රාජ්‍ය ආයතනවලින් ලං.ඛ.නී.සං.ට අයවිය යුතු හිඟ මුදල 2020 වසරේ දී රුපියල් බිලියන 142.7ක් දක්වා රුපියල් බිලියන 10.5කින් පහළ ගියේය. 2020 වසර අවසානයේ දී, ලං.වි.ම. හා ශ්‍රීලංකන් ගුවන් සේවය වෙතින් අය විය යුතු හිඟ මුදල, ලං.ඛ.නී.සං. වෙත අය විය යුතු සමස්ත හිඟ මුදලින් සියයට 89.2කට පමණ දායක විය.

**2020 වසර තුළ දී ඛනිජ තෙල් අංශයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති මන්දගාමී ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක විණි.** ආයෝජන නොමැති වීම හේතුවෙන් පසුගිය දශකය තුළ සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීමේ සහ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) එතරම් ප්‍රගතියක් අත්කර නොගත් අතර, 2020 වසරේ දී ලං.ඛ.නී.සං. මගින් එය නවතා දමන ලදී. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයක් යටතේ, දිනකට බැරල් 100,000ක ධාරිතාවක් සපයන නව පිරිපහදුවක් සපුගස්කන්දෙහි පිහිටුවීම සඳහා අවශ්‍ය නව ශක්‍යතා අධ්‍යයනයක් ආරම්භ කිරීමට 2020 නොවැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් ලං.ඛ.නී.සං.ට අනුමැතිය ලබා දෙන ලදී. එම ශක්‍යතා අධ්‍යයනය මගින් ආර්ථිකය තුළ වෙනස්වන ඉන්ධන අවශ්‍යතා සහ අදාළ තාක්ෂණ ක්‍රමවේදයන්හි මෑත කාලීන දියුණුව ද සලකා බැලීමට නියමිතය. රජය විසින් සිදු කරනු ලබන අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණය, සංවර්ධන හා නිෂ්පාදන කටයුතු සඳහා වන නියාමන ආයතනය වන ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ ස්වභාවික වායු පිළිබඳ ගවේෂණය කිරීම සඳහා ආයෝජකයින්ගේ රුචිය ඇති කිරීමේ උත්සාහයක් ලෙස ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2020 ඔක්තෝබර් මාසයේ දී ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

## විදුලිබලය

**2020 වසරේ දී සමස්ත විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 15,714ක් දක්වා සියයට 1.3කින් පහළ ගියේය.** කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා පනවනු ලැබූ ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීම් මධ්‍යයේ විදුලිබලය සඳහා වූ ඉල්ලුම පහළ යෑම හේතුවෙන් 2020 වසරේ මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවල දී විදුලිබල උත්පාදනයේ සැලකිය යුතු පහළ යෑමක් දක්නට ලැබුණි. දීපව්‍යාප්තව පනවා තිබූ ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීම් ඉවත් කිරීම සහ ආර්ථිකය ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත්වීම සමඟ, 2020 වසරේ ජුනි මාසය තුළ දී විදුලිබල උත්පාදනයේ ඉහළ යෑමක් නැවත වාර්තා විය. කෙසේ වෙතත්, වසංගතයේ දෙවන රැල්ල හේතුකොටගෙන වසර අග වන විට සමස්ත විදුලිබල උත්පාදනයෙහි පහළ යෑමේ ප්‍රවණතාවක් වාර්තා විය. විදුලිබල උත්පාදන සංයුතිය සැලකීමේ දී, ජල පෝෂක ප්‍රදේශවලට ලැබුණු ප්‍රමාණවත් වර්ෂාපතනය සමඟ ජලාශවල ජල මට්ටම යහපත් මට්ටමක පැවතීම හේතුවෙන් 2020 වසර තුළ දී ජල විදුලිබල උත්පාදනය ඉහළ ගියේය. පෙර වසරවල දක්නට ලැබුනු පරිදි කෙරවලපිටිය ගල් අඟුරු බලාගාරයේ ඒකක දීර්ඝ කාලයක් පුරා වසා තැබීම් සිදු නොවීම හේතුවෙන් 2020 වසරේ දී ගල් අඟුරු භාවිතයෙන් කෙරෙන විදුලිබල උත්පාදනය ද ඉහළ ගියේය. තවද, දැවි තෙල් සහ ඩීසල් වැනි නිෂ්පාදන යොදා ගැනෙන ද්‍රව ඉන්ධන පදනම් කරගත් විදුලිබල උත්පාදනයට වඩා ගල් අඟුරු භාවිතයෙන් සිදු කෙරෙන විදුලිබල උත්පාදනය වඩා ලාභදායී වේ. ජලය සහ ගල් අඟුරු භාවිතයෙන් කෙරෙන විදුලිබල උත්පාදනය ඉහළ යෑමෙහි ඒකාබද්ධ බලපෑම, ද්‍රව ඉන්ධන භාවිතයෙන් කෙරෙන පිරිවැය අධික විදුලිබල උත්පාදනයෙහි සැලකිය යුතු පහළ යෑම කෙරෙහි සහාය විය. මේ අතර, සුළු පරිමාණ ජල විදුලි බලාගාර ද ඇතුළු සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව භාවිතයෙන් සිදු කෙරෙන විදුලිබල උත්පාදනය 2020 වසරේ දී ඉහළ ගියේය. සමස්තයක් වශයෙන් ගත්විට, 2020 වසරේ මුළු විදුලිබල උත්පාදනය සඳහා ලං.වි.ම.හි දායකත්වය සියයට 70.9ක් වූ අතර, ඉතිරිය සඳහා දායකත්වය ලැබුණේ ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගෙනි.

**3.4 රූප සටහන**
**විදුලිබල උත්පාදන සංයුතිය**




මූලය: ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය

තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, විදුලිය සඳහා ගෘහස්ත අංශයේ ඉල්ලුමෙහි වර්ධනය ඉක්මවා කර්මාන්ත අංශයේ ඉල්ලුම පහළ යෑම බොහෝ දුරට හේතුකොටගෙන, 2020 වසරේ දී මුළු විදුලිබල අලෙවිය ගි.වො.පැ. 14,287ක් දක්වා සියයට 2.2කින් අඩුවිය. කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් අඩපණ වීම පිළිබිඹු කරමින් කර්මාන්ත, පොදු සේවා හා හෝටල් යන අංශවලින් වූ ඉල්ලුම පහළ යෑම, විදුලිබල අලෙවිය පහළ යෑම සඳහා මූලික විය. මේ අතර, කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය මැඩපැවැත්වීම සඳහා පැනවූ සංචරණ සීමා හේතුවෙන් පුද්ගලයින්ට නිවාස තුළම රැඳී සිටීමට සිදුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස විදුලිය සඳහා ගෘහස්ත අංශයේ ඉල්ලුම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, ගෘහස්ත, රාජ්‍ය, කර්මාන්ත, පොදු සේවා හා හෝටල් යන අංශවලට අලෙවි කරන ලද විදුලිබලය සමස්ත අලෙවියෙන්, පිළිවෙළින්, සියයට 35.6ක්, සියයට 1.4ක්, සියයට 29.1ක්, සියයට 19.9ක් හා සියයට 1.3ක් විය. කෙසේ වෙතත්, විදුලිබල පරිභෝජන බිල්පත් සැකසීම මනු කියවන්නන් හරහා සිදුකළ බැවින් ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබූ කාලය තුළ දී විදුලි බිල්පත් සම්බන්ධයෙන් විදුලි පාරිභෝගිකයෝ මෙන්ම ලං.වි.ම. යන දෙපාර්ශ්වයම අසීරුතාවයට පත් වූහ. විදුලි පරිභෝජන දත්ත ලබා ගැනීම සඳහා දුරස්ථව ප්‍රවේශ වීමේ හැකියාව ලබාදෙන සහ තත්කාලීනව භාවිතය ඇස්තමේන්තු කිරීමේ හැකියාව සපයන සුහුරු මනු කියවීමේ තාක්ෂණය (Smart Metering Technology) හඳුන්වාදීමේ වැදගත්කම මින් අවධාරණය කෙරේ. විශේෂයෙන්ම, සමාජ හා භෞතික අවහිරතා පවතින ඕනෑම කාලයක දී එවැනි තාක්ෂණයක් වැදගත් වේ.

ඉල්ලුම අඩු වීම සහ හිතකර උත්පාදන සංයුතිය හේතුවෙන් පිරිවැය අධික ද්‍රව ඉන්ධන භාවිතයෙන් කෙරෙන විදුලි උත්පාදනය මත රැඳී සිටීම පහළ යෑමත්

**3.3 සංඛ්‍යා සටහන**
**විදුලිබල අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2019(අ) | 2020(ආ) | වර්ධන අනුපාතය % 2019(අ) | වර්ධන අනුපාතය % 2020(ආ) |
|---|---|---|---|---|
| ස්ථාපිත ධාරිතාව (මෙගාවොට්) | 4,217 | 4,263 | 4.2 | 1.1 |
| ජල විදුලිබලය (ඇ) | 1,399 | 1,383 | - | -1.1 |
| ද්‍රව ඉන්ධන (ඈ) | 1,282 | 1,268 | 12.8 | -1.1 |
| ගල් අඟුරු | 900 | 900 | - | - |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඉ) | 636 | 713 | 4.1 | 12.1 |
| ජනනය කළ ඒකක (ගිගාවොට් පැය) | 15,922 | 15,714 | 3.6 | -1.3 |
| ජල විදුලිබලය (ඇ) | 3,783 | 3,911 | -26.5 | 3.4 |
| ද්‍රව ඉන්ධන (ඈ) | 5,016 | 4,182 | 38.2 | -16.6 |
| ගල්අඟුරු | 5,361 | 5,754 | 12.5 | 7.3 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඉ) | 1,761 | 1,866 | -3.8 | 5.9 |
| මුළු අලෙවිය (ලං.වි.ම.) (ගිගාවොට් පැය) | 14,611 | 14,287 | 3.7 | -2.2 |
| ගෘහස්ථ සහ ආගමික | 4,863 | 5,172 | 4.8 | 6.4 |
| කර්මාන්ත | 4,392 | 4,164 | 2.4 | -5.2 |
| පොදු සේවා සහ හෝටල් (ඊ) | 3,563 | 3,238 | 4.4 | -9.1 |
| වීදි ආලෝක කිරීම | 109 | 109 | 0.1 | 0.2 |
| ලං.වි. සමාගම (LECO) | 1,684 | 1,605 | 2.7 | -4.7 |
| ලං.වි. සමාගමේ විදුලි අලෙවියේ සංයුතිය (ගිගාවොට් පැය) | 1,646 | 1,569 | 5.1 | -4.7 |
| ගෘහස්ථ සහ ආගමික | 692 | 716 | 8.1 | 3.4 |
| කර්මාන්ත | 293 | 269 | 1.7 | -8.1 |
| පොදු සේවා සහ හෝටල් (ඊ) | 640 | 562 | 3.7 | -12.1 |
| වීදි ආලෝක කිරීම | 21 | 22 | - | 2.4 |
| ලං.වි.ම. සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ සමස්ත හානිය (%) | 8.2 | 9.1 | -1.3 | 10.3 |
| පාරිභෝගිකයන් සංඛ්‍යාව ('000) (උ) | 6,501 | 6,636 | 2.3 | 2.1 |
| ඉන්, ගෘහස්ථ සහ ආගමික | 5,692 | 5,792 | 2.0 | 1.8 |
| කාර්මික | 64 | 66 | 2.8 | 2.5 |
| පොදු සේවා හා හෝටල් (ඊ) | 744 | 777 | 4.9 | 4.5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සුළු පරිමාණ ජල විදුලි බලාගාර ඇතුළත් නොවේ.
(ඈ) ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගෙන් මිල දී ගත් විදුලිබලය ද ඇතුළත්ය.
(ඉ) සුළු පරිමාණ ජල විදුලිබලය ඇතුළත්ව
(ඊ) රාජ්‍ය අංශය සඳහා සිදුකළ අලෙවිය ද ඇතුළත්ය.
(උ) සී. ස. ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ පාරිභෝගිකයින් ද ඇතුළත්ව

මූලයන්: ලංකා විදුලිබල මණ්ඩලය
සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

3

**සමඟ, පෙර වසර හා සැසඳීමේ දී 2020 වසරේදී ලං.වි.ම.හි මූල්‍ය කාර්ය සාධනයෙහි දුර්වලත්වය අඩු විය.** විගණනය නොකළ තාවකාලික මූල්‍ය දත්තවලට අනුව, ලං.වි.ම. පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 97.4ක අලාභයට සාපේක්ෂව, 2020 වසරේ දී රුපියල් බිලියන 62.6ක අලාභයක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් බැංකු අංශය, ලං.බ.නී.සං. සහ ස්වාධීන විදුලි නිෂ්පාදකයින් සඳහා වූ ලං.වි.ම.හි කෙටි කාලීන මූල්‍ය වගකීම්, 2019 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 223.8ක සිට 2020 වසර අවසානය වන විට රුපියල් බිලියන 212.9ක් දක්වා අඩු වූ අතර, ලං.වි.ම.හි දිගු කාලීන නොපියවූ ණය වගකීම් 2019 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 433.6ක සිට 2020 වසර අවසානය වනවිට රුපියල් බිලියන 477.1ක් දක්වා ඉහළ ගියේය. ලං.වි.ම.හි අඛණ්ඩව පවතින දුර්වල මූල්‍ය තත්ත්වය මගින් පිරිවැය පිළිබිඹු කෙරෙන මිල යාන්ත්‍රණයක් යොදා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කෙරෙන අතර, දිගුකාලීන විදුල බල උත්පාදන විකාශන සැලසුම කඩිනම් කිරීම සහතික කරමින් පිරිවැය අවම බලශක්ති ප්‍රභවයන්ගේ උත්පාදන ශක්‍යතාව ඉහළ නැංවීමේ අවශ්‍යතාව ද අවධාරණය කරයි.

**වසංගතය මධ්‍යයේ විදුලි පාරිභෝගිකයන් වෙත කාර්යක්ෂම සේවාවක් ලබාදීම සහතික කිරීම සඳහා 2020 වසරේ දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ප්‍රයත්න දරන ලදී.** මනු කියවීම ප්‍රමාද වුව ද පාරිභෝගිකයන්ට සාධාරණයක් සිදු කිරීම සහතික කිරීම සඳහා ප්‍රමාණානුකූල පදනමකින් බිල්පත් ගණනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමට මහජන උපයෝගිතා කොමිෂන් සභාව, ලං.වි.ම. හා ලංකා විදුලි පුද්ගලික සමාගම සමඟ එක්ව, මාර්ගෝපදේශ මාලාවක් සකස් කළේය. තවද, පාරිභෝගිකයන්ගේ මූල්‍ය දුෂ්කරතා සලකා බලමින්, ආර්ථික සහ සමාජ කටයුතු සීමා කර තිබූ කාලය තුළ බිල්පත් ගෙවීම සඳහා සහන කාලයක් ලබා දෙන ලදී. එසේම, ලං.වි.ම.හි හා ලංකා විදුලි පුද්ගලික සමාගමෙහි මූල්‍ය ශක්‍යතාව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නියමිත කලට බිල්පත් ගෙවීම සඳහා පාරිභෝගිකයන් දිරිමත් කරවන ලදී. විදුලිය සේවා සම්බන්ධ තොරතුරු සපයන අතරම, පාරිභෝගික පැමිණිලි විසඳීම සඳහා කොමිෂන් සභාව විසින් පළාත් මට්ටමින් ජංගම සේවාවක් දියත් කරන ලදී. පාරිභෝගිකයන්ට, තමන්ට ආසන්න ප්‍රදේශවල සිටින විදුලි කාර්මිකයන්ගේ සහ ජල නල කාර්මිකයන්ගේ සේවාව පහසුවෙන් ලබාගත හැකි වන පරිදි සෑම දිස්ත්‍රික්කයකම ජීවත්වන ලියාපදිංචි කළ විදුලි කාර්මිකයන් සහ නල කාර්මිකයන්ගේ තොරතුරු ඇතුළත් වන දත්ත ගොනුවක් ද ස්ථාපිත කරන ලදී. මේ අතර, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි, අඩු පිරිවැය විදුලිබල උත්පාදනය පිළිබඳව නිසි අවධානය යොමු කරමින්

**3.4 සංඛ්‍යා සටහන**

**සාමාන්‍ය විදුලිබල පිරිවැය සහ සාමාන්‍ය විදුලිබල ගාස්තු**


| ශීර්ෂය | 2019 | 2020(අ) | වර්ධන අනුපාතය (%) 2019 | 2020(අ) |
|---|---|---|---|---|
| 1. ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.) | 12.91 | 9.90 | 36.0 | -23.3 |
| ජල විදුලිය | 2.49 | 2.32 | 38.6 | -7.0 |
| ද්‍රව ඉන්ධන | 32.12 | 29.94 | 11.7 | -6.8 |
| ගල් අඟුරු | 12.45 | 9.81 | 25.4 | -21.2 |
| 2. පෞද්ගලික අංශයේ සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.) | 26.47 | 22.56 | 8.2 | -14.8 |
| ද්‍රව ඉන්ධන | 30.16 | 27.87 | -5.7 | -7.6 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව (ආ) | 18.22 | 17.55 | 11.6 | -3.7 |
| 3. සමස්ත සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.) | | | | |
| විකුණුම් අවස්ථාවේ දී | 24.11 | 21.20 | 26.0 | -12.0 |
| උත්පාදන අවස්ථාවේ දී | 16.62 | 13.56 | 30.3 | -18.4 |
| 4. සාමාන්‍ය ගාස්තු (රු./කි.වො.පැ.) | 16.63 | 16.72 | 2.0 | 0.6 |
| ගෘහස්ථ | 14.13 | 14.87 | 3.9 | 5.2 |
| පොදු සේවා | 23.94 | 23.91 | 0.7 | -0.1 |
| රාජ්‍ය අංශය | 18.18 | 18.06 | -0.3 | -0.7 |
| කර්මාන්ත | 14.72 | 14.84 | - | 0.8 |
| හෝටල් | 17.71 | 18.13 | 0.6 | 2.4 |

(අ) තාවකාලික
(ආ) සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව තුළ ජල විදුලිය සඳහා වූ සාමාන්‍ය පිරිවැය ඇතුළත් වේ.

මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

**3.5 රූප සටහන**

**විදුලිබලය : සාමාන්‍ය පිරිවැය හා සාමාන්‍ය ගාස්තුව**




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

රටේ බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීමේ අරමුණ ඇතිව, ලං.වි.ම. විසින් අඩු පිරිවැය දිගු කාලීන උත්පාදන විකාශන සැලසුම 2020-2039 කාල සීමාව දක්වා සංශෝධනය කරන ලදී.

**කොවිඩ්-19 ආශ්‍රිත සීමා මධ්‍යයේ මන්දගාමී වේගයකින් වුව ද, ව්‍යාපෘති කිහිපයක ඉදිකිරීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක විය.** උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය (මෙ.වො. 120), මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය (මෙ.වො. 30.5) සහ බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතියට (මෙ.වො. 35) අදාළ ඉදිකිරීමේ කටයුතු වසර තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, 2020 වසර අවසානය වන විට ඒවායේ භෞතික ප්‍රගතිය, පිළිවෙළින්, සියයට 96ක්, සියයට 26ක් සහ සියයට 78ක් විය. මන්නාරම් සුළං බල ව්‍යාපෘතියේ (මෙ.වො. 100) භෞතික ප්‍රගතිය වසර අවසානයේ දී සියයට 81ක් වූ අතර, 2021 ජුනි මස වන විට එය ජාතික පද්ධතියට එක් කිරීමට අපේක්ෂා කෙරේ. මේ අතර, වසර තුළ දී ග්‍රාමීය විදුලිබලය සැපයීමේ වැඩසටහන් 33ක් සම්පූර්ණ කරන ලද අතර, මෙ.වො. 64ක ධාරිතාවක් ජාතික පද්ධතියට එක් කරමින් වසර තුළ දී සූර්ය බල සංග්‍රාමය ව්‍යාපෘතිය සඳහා පාරිභෝගිකයෝ 4,400ක් සම්බන්ධ වූහ.

### මාර්ග සංවර්ධනය

**විශේෂයෙන්ම, වසරේ මාර්තු මැද භාගයේ සිට අප්‍රේල් අග දක්වා කාලය තුළ වසංගතය හේතුවෙන් අවහිරතා ඇති වුව ද, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2020 වසර තුළ දී සිය සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යන ලදී.** 2020 වසර අවසානය වනවිට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරනු ලැබූ A සහ B කාණ්ඩයේ මාර්ග ඇතුළු ජාතික මහාමාර්ගවල සමස්ත දිග කිලෝමීටර් 12,224ක් වූ අතර, අධිවේගී මාර්ගවල මුළු දිග කිලෝමීටර් 271.7ක් විය. වසර තුළ දී අධිවේගී හා මහා මාර්ග නඩත්තුව හා සංවර්ධනය, මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම, පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම සහ ස්වභාවික ආපදාවලින් බලපෑමට ලක් වූ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රුපියල් බිලියන 226.1ක වියදමක් දරා ඇත. එම වියදම 2019 වසරේ වැය කළ වියදමට වඩා සියයට 48ක ඉහළ අගයක් වේ. ඒ අනුව, වසර තුළ දී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අධිවේගී මාර්ග සහ මහා මාර්ග සංවර්ධනය සඳහා, පිළිවෙළින්, රුපියල් බිලියන 99.7ක් සහ රුපියල් බිලියන 92.6ක් වැය කර ඇති අතර, පාලම් සහ ගුවන් පාලම් ඉදි කිරීම සඳහා රුපියල් බිලියන 17.5ක් වැය කර ඇත. කෙසේ වෙතත්, වසර තුළ දී වැය කර ඇති සමස්ත වියදම, 2020 වසර සඳහා වෙන් කරන ලද රුපියල් බිලියන 249.5කට වඩා අඩු අගයක් විය.

**රටේ අධිවේගී මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම ඉලක්ක කර ගත් සංවර්ධන කටයුතු වසර තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය.** මාතර සිට හම්බන්තොට දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම සහ මත්තල සම්බන්ධ කරමින් අධිවේගී මාර්ග කොටසක් සංවර්ධනය කිරීම වසර තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඒ අනුව, ගොඩගම, පාලටුව, බෙලිඅත්ත සහ බරවකුඹුක සම්බන්ධ කෙරෙන අධිවේගී මාර්ග කොටස 2020 පෙබරවාරි මාසයේ දී මහජනතාව සඳහා විවෘත කෙරිණි. අන්දරවැව හරහා මත්තල සිට හම්බන්තොට දක්වා දිවෙන අධිවේගී මාර්ග කොටසෙහි ඉදිකිරීම් කටයුතු ද 2020 වසරේ දී සම්පූර්ණ කරන ලදී. මේ අතර, කඩවත සිට මීරිගම දක්වා සහ මීරිගම සිට කුරුණෑගල දක්වා වූ අධිවේගී මාර්ග කොටස් දෙකකින් සමන්විත මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සලකා බලන වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2020 වසර අවසන් වන විට කඩවත සිට මීරිගම දක්වා වූ අධිවේගී මාර්ග කොටසෙහි භෞතික ප්‍රගතිය සියයට 5.4ක පමණ පහළ මට්ටමක පැවතිය ද, මීරිගම සිට කුරුණෑගල දක්වා වූ අධිවේගී මාර්ග කොටසෙහි A,B,C සහ D යන කොන්ත්‍රාත් පැකේජ සියල්ලෙහි භෞතික ප්‍රගතියේ සාමාන්‍යය සියයට 83ක් පමණ විය. වසර තුළ දී අරමුදල් හිඟ වීම මෙන්ම සිදු කළ යුතුව ඇති ගෙවීම් ඒකරාශී වීම හේතුවෙන් පොතුහැර සිට ගලගෙදර දක්වා සහ කුරුණෑගල සිට දඹුල්ල දක්වා වූ මධ්‍යම අධිවේගී මාර්ගයේ කොටස්වලට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවල ප්‍රමාදයක් ඇති විය. යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයට අදාළ ශක්‍යතා අධ්‍යයනය 2018 වසරේ පළමු භාගය තුළ දී අවසන් කර තිබුණ ද, අධිවේගී මාර්ගයේ ඉංගිරිය සිට පැල්මඩුල්ල දක්වා කොටසට අදාළ ශක්‍යතා අධ්‍යයනය පාරිසරික බලපෑම් පිළිබඳව විශේෂ අවධානයක් සහිතව 2020 වසරේ දී නැවත ඇගයීමට ලක් කරන ලදී. කහතුඩුව සිට ඉංගිරිය දක්වා කොටස ආවරණය වන රුවන්පුර අධිවේගී මාර්ගයේ පළමු අදියර යටතේ ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු 2020 වසර අවසානය වනවිට සියයට 60ක ප්‍රගතියක් පෙන්නුම් කළේය.

**වසර තුළ දී ක්‍රියාත්මක කෙරුණු සංචරණ සීමා මධ්‍යයේ අධිවේගී මාර්ගවල ධාවනය කළ රථ වාහන සංඛ්‍යාව පහළ ගියේය.** ඒ අනුව, 2020 වසරේ දී කොට්ටාව සිට ගොඩගම දක්වා දක්ෂිණ

3

අධිවේගී මාර්ගයේ, කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ සහ පිටත වට රවුම් මාර්ගයේ ගමන් කළ දෛනික රථ වාහන සංඛ්‍යාවේ සාමාන්‍යය, පිළිවෙළින්, සියයට 16.6කින්, සියයට 26.4කින් හා සියයට 0.5කින් පහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසරේ දී අධිවේගී මාර්ගවලින් උපයාගත් සමස්ත ආදායම රුපියල් බිලියන 7.3ක් දක්වා සියයට 15.5කින් පහළ ගියේය.

**කොවිඩ්-19 ආශ්‍රිත අවහිරතා මධ්‍යයේ, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ග හා පාලම් සංවර්ධන වැඩසටහන් කිහිපයක් අඛණ්ඩව කරගෙන යන ලදී.** 2020 වසරේ මුල් කාලය තුළ දී ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබීමත් සමග ශ්‍රමිකයන්ගේ සංචරණය සීමා වීම මෙන්ම, අවශ්‍ය ඉදිකිරීම් අමුද්‍රව්‍ය ආනයනය සීමා වීම හේතුකොටගෙන මාර්ග සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් තාවකාලිකව නවතා දැමුණි. මේ අතර, බේස්ලයින් මාර්ග ව්‍යාපෘතියෙහි තුන්වෙනි අදියරට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වසර තුළ දී ක්‍රියාත්මක වූ අතර, 2020 වසර අවසානය වන විට අවශ්‍ය ඉඩම් ප්‍රමාණයෙන් සියයට 48.6ක් අත්පත් කරගෙන තිබුණි. කුලුණු මතින් දිවෙන මහා මාර්ග ව්‍යාපෘතියේ පළමුවන අදියරෙහි පාරිසරික බලපෑම් තක්සේරු කිරීම 2020 වසරේ දී සම්පූර්ණ කළ අතර, ඒ සඳහා ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීමේ කටයුතු වසර තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය. එම ව්‍යාපෘතියේ දෙවන අදියර එනම්, රාජගිරිය සිට අතුරුගිරිය දක්වා වූ මාර්ග කොටසට අදාළව ශක්‍යතා අධ්‍යයනය ද 2020 වසරේ දී සම්පූර්ණ කරන ලදී. 2020 වසරේ දී, අලව්ව, මුත්තෙට්ටුගල සහ කොම්පඤ්ඤ වීදිය ගුවන් පාලම් ඉදිකිරීමට අදාළ ශක්‍යයතා අධ්‍යයනය සම්පූර්ණ කෙරුණු අතර, කොච්චිකඩේ අතුරු මාර්ගය සහ දෙහිවල සිට පානදුර දක්වා සමුද්‍ර මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා අධ්‍යයනය සිදු කෙරෙමින් පැවතිණි. ජාතික ප්‍රතිපත්ති රාමුවට සමගාමීව, ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග සඳහා ප්‍රවේශය ඉහළ නැංවීමට කිලෝමීටර 100,000කින් සමන්විත විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීමේ වැඩසටහන වසර තුළ දී ආරම්භ කරන ලදී. තවද, මධ්‍යම අධිවේගී මාර්ගයේ වූ සම්බන්ධතා වැඩි දියුණු කිරීම පිණිස මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ දෙවන කොටස යටතේ පස්යාල සිට ගිරිඋල්ල සහ අලව්ව සිට දඹපැලැස්ස දක්වා වූ ජාතික මාර්ග ද්විත්වයට අදාළ මාර්ග වැඩි දියුණු කිරීමේ කටයුතු ද, 2020 වසරේ දී ආරම්භ විය.

## මාර්ගස්ථ මගී ප්‍රවාහනය


**කොවිඩ්-19 ආශ්‍රිත සංචරණ සීමා හේතුවෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ පොදු සහ පෞද්ගලික යන දෙඅංශයේම ප්‍රවාහන කටයුතුවල දුර්වල කාර්යසාධනයක් දක්නට ලැබුණි.** මාර්තු මැද භාගයේ සිට අප්‍රේල් අවසානය දක්වා කාලය තුළ දීප ව්‍යාප්තව සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස පොදු මගී ප්‍රවාහනය තාවකාලිකව නවතා දැමුණි. මැයි මාසයේ මුල් කාලයේ සිට සංචරණ සීමා ලිහිල් කිරීමත් සමඟ පොදු මගී ප්‍රවාහන කටයුතු ක්‍රමයෙන් වර්ධනය වුව ද, ප්‍රාදේශීය වශයෙන් සමාජ හා ආර්ථික කටයුතු සීමාකර තැබීම් හේතුවෙන් 2020 වසරේ අවසාන කාර්තුවේ දී ප්‍රවාහන කටයුතු කෙරෙහි නැවතත් බලපෑම් ඇති විය. ඒ අනුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලං.ග.ම.) සහ පෞද්ගලික අංශයේ ධාවන කිලෝමීටර් ගණන සහ මගී කිලෝමීටර ගණන 2020 වසරේ දී සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළේය. 2020 වසර තුළ දී ශ්‍රී ලං.ග.ම. සතු බස් රථවල මුළු ධාවන කිලෝමීටර ගණන සහ මගී කිලෝමීටර ගණන, පිළිවෙළින්, සියයට 28.4ක සහ සියයට 32.2ක පහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, ශ්‍රී ලං.ග.ම. මගින් ධාවනය වූ බස් රථ සංඛ්‍යාව 2019 වසරේ දී 5,048ක් අතර, එය 2020 වසරේ දී 4,045ක් දක්වා පහළ ගියේය. 2020 වසර තුළ දී පෞද්ගලික අංශයේ බස් රථවල මුළු මගී ධාවන කිලෝමීටර් ගණන සහ මුළු ධාවන කිලෝමීටර ගණන, පිළිවෙළින්, සියයට 65.8කින් සහ සියයට 64.9කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. 2019 වසර අවසානයේ දී පෞද්ගලික අංශය සමස්ත බස් රථ පන්තියෙන් ධාවනයේ පැවති සියයට 92.9ක ප්‍රමාණය හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට පෞද්ගලික අංශයේ සමස්ත බස් රථවලින් සියයට 53.6ක් පමණක් ධාවනයේ පැවතිණි. මේ අතර, වසර අවසානය වන විට ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් පළාත් අතර බස් රථ ධාවනයට බලපත්‍ර 3,069ක් ද, පළාත් තුළ බස් රථ ධාවනයට බලපත්‍ර 17,054ක් ද පෞද්ගලික අංශයට ලබා දී තිබුණි.

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ක්‍රියාවට නැංවීමට නියමිතව පැවති ගමනාගමනය වැඩි දියුණු කිරීමේ කටයුතු කෙරෙහි 2020 වසර තුළ දී සැලකිය යුතු අවහිරතා ඇති විය.** සලකා බලන වසර තුළදීකොවිඩ්-19 වසංගතයමධ්‍යයේවිශේෂපොදුප්‍රවාහන සේවා සැපයීමට ශ්‍රී ලං.ග.ම. සමඟ සහයෝගීතාවයෙන්

යුතුව 'සිසු සැරිය', 'ගැමි සැරිය' සහ 'නිසි සැරිය' යන විශේෂ බස් රථ සේවා පුළුල් කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව අඛණ්ඩව අවධානය යොමු කළේය. 2020 වසර මුල් භාගයේ දී සිසු සැරිය සේවා සඳහා අමතර බස් රථ 30ක් අලුතින් එක් කරන ලදී. පොදු ප්‍රවාහන කටයුතු කෙරෙහි වූ අවහිරතා හේතුවෙන්, 2020 වසර අවසානය වන විට ගැමි සැරිය සේවාව යටතේ ධාවනය කළ සමස්ත බස් රථ සංඛ්‍යාව 16ක් දක්වා ඉහළ නංවමින් වසර තුළ දී ගැමි සැරිය සේවාව සඳහා එක් නව බස් රථයක් පමණක් එකතු කරන ලදී. රාත්‍රී කාලයේ ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා වසර තුළ දී නිසි සැරිය බස් රථ සේවාවට නව බස් රථ 13ක් එක් කිරීමත් සමඟ, 2020 දෙසැම්බර් අවසානය වන විට මෙම සේවාවට අදාළ සමස්ත බස් රථ සංඛ්‍යාව 192ක් දක්වා ඉහළ ගියේය. 2020 වසර තුළ දී සිසු සැරිය, ගැමි සැරිය හා නිසි සැරිය සේවා සඳහා වැය කළ වියදම, පිළිවෙළින්, රුපියල් මිලියන 385.6ක්, රුපියල් මිලියන 4.2ක් සහ රුපියල් මිලියන 12.3ක් විය. කොවිඩ්-19 ආශ්‍රිත සෞඛ්‍ය නිර්දේශ සැලකිල්ලට ගනිමින්, ප්‍රවාහන සේවා සඳහා ආසන ධාරිතා සීමා හඳුන්වාදීම හේතුවෙන්, පෞද්ගලික අංශයේ බස් රථ ධාවකයින් විසින් සිය ආදායම් පහළ යෑම පිළිබඳව කණස්සල්ල පල කරන ලදී. ඒ අනුව, සාමාන්‍ය බස් රථ සේවාවලට අදාළ ගාස්තු සියයට 20කින් ඉහළ දමමින් බස් ගාස්තු සංශෝධනය කිරීම සඳහා 2020 නොවැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩලය සිය විශේෂ අනුමැතිය ලබා දුන්නේය.

**කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ පොදු ප්‍රවාහන සේවා භාවිතය සහ සේවා මෙහෙයුම් සීමා වීම ශ්‍රී ලං.ග.ම.යෙහි මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති කළේය.** විගණනය නොකළ තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව මඟී සංචරණය පහළ යෑම හේතුවෙන් ශ්‍රී ලං.ග.ම.යෙහි සමස්ත ආදායම රුපියල් බිලියන 31.2ක් දක්වා සියයට 28.2කින් පහළ ගියේය. මෑත වසර කිහිපය තුළ දී මෙහෙයුම් ලාභයක් වාර්තා කළ ශ්‍රී ලං.ග.ම. 2019 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 1.6ක ලාභය හා සැසඳීමේ දී, 2020 වසරේ දී රුපියල් බිලියන 2.3ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය. මේ අතර, ලාභ ඉපයිය නොහැකි මාර්ගවල බස් රථ ධාවනයේ යෙදවීම සහ සහනාධාර වාර ප්‍රවේශ පත්‍ර සඳහා රජය විසින් ප්‍රදානය කළ සහනාධාර ප්‍රමාණය, 2019 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 10.9 හා සැසඳීමේ දී 2020 වසරේ දී රුපියල් බිලියන 10.7ක් විය.

**3.6 රූප සටහන**
**රථවාහන නව ලියාපදිංචිය**




මූලය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**පෞද්ගලික භාවිතය සඳහා රථ වාහන ආනයනය ද ඇතුළත්ව අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම සඳහා රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ දී රථවාහන නව ලියාපදිංචි කිරීම් විශාල වශයෙන් පහළ ගියේය.** ඒ අනුව, 2020 වසරේ දී රථ වාහන නව ලියාපදිංචිය සියයට 44.8කින් පහළ ගියේය. සියලුම රථවාහන කාණ්ඩවල ලියාපදිංචියෙහි සැලකිය යුතු අඩු වීමක් දක්නට ලැබුණු අතර, මෝටර් රථ, බස් රථ සහ ත්‍රිරෝද රථ නව ලියාපදිංචිය, පිළිවෙළින්, සියයට 45.0කින්, සියයට 64.2කින් සහ සියයට 53.8කින් පහළ ගියේය.

## දුම්රිය ප්‍රවාහනය

**කොවිඩ්-19 ව්‍යාප්තියත් සමඟ සංචරණ සීමා පැනවීමෙහි බලපෑම හේතුවෙන් 2020 වසරේ දී ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී ලං.දු.සේ.) දුර්වල කාර්යසාධනයක් වාර්තා කළේය.** ඒ අනුව, වසර තුළ දී ශ්‍රී ලං.දු.සේ.හි සමස්ත ධාවන කිලෝමීටර ගණන හා මඟී කිලෝමීටර ගණන, පිළිවෙළින්, සියයට 28.9කින් සහ සියයට 46.6කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. දිවයින පුරා ව්‍යාප්තව පනවා තිබූ සංචරණ සීමා 2020 අප්‍රේල් මස අග සිට ඉවත් කිරීමත් සමඟ, දුම්රිය මඟී කිලෝමීටර ගණන, ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වුව ද, එය වසංගත කාලපරිච්ඡේදයට පෙර වාර්තා වූ සාමාන්‍ය දුම්රිය මඟී කිලෝමීටර ගණනට වඩා පහළ

### 3.5 සංඛ්‍යා සටහන
### ගමනාගමන අංශයේ මූලික ලක්ෂණ

| ශීර්ෂය | 2019 (අ) | 2020 (ආ) | වර්ධන අනුපාතය % 2019 (අ) | වර්ධන අනුපාතය % 2020 (ආ) |
|---|---|---|---|---|
| 1. රථවාහන නව ලියාපදිංචි කිරීම (සංඛ්‍යාව) | 367,303 | 202,628 | -23.6 | -44.8 |
| බස් රථ | 1,613 | 578 | -45.5 | -64.2 |
| මෝටර් රථ | 38,232 | 21,021 | -52.7 | -45.0 |
| ත්‍රිරෝද රථ | 15,490 | 7,150 | -22.8 | -53.8 |
| ද්විත්ව කාර්ය වාහන | 13,459 | 9,532 | -20.5 | -29.2 |
| යතුරු පැදි | 284,301 | 151,634 | -16.3 | -46.7 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | 5,223 | 3,941 | -44.3 | -24.5 |
| ඉඩම් වාහන | 7,666 | 8,302 | -25.4 | 8.3 |
| කොඩ්‍රිසයිකල් සහ මෝටර් නිවාස | 1,319 | 470 | 101.1 | -64.4 |
| 2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | | | | |
| ධාවන කිලෝමීටර් (මිලියන) | 431 | 309 | -3.4 | -28.4 |
| මගී කිලෝමීටර් (මිලියන) | 14,346 | 9,725 | -7.7 | -32.2 |
| මුළු ආදායම (රු. මිලියන) | 43,490 | 31,233 | -1.4 | -28.2 |
| මෙහෙයුම් වියදම (රු. මිලියන) | 41,933 | 33,565 | - | -20.0 |
| මෙහෙයුම් ලාභය (+)/ අලාභය (-) (රු. මිලියන) | 1,557 | -2,331 | -28.2 | -249.8 |
| 3. ශ්‍රී ලංකා දුම්රිය සේවය | | | | |
| ධාවන කිලෝමීටර් ('000) | 11,230 | 7,990 | -3.5 | -28.9 |
| මගී කිලෝමීටර් (මිලියන) | 7,310 | 3,906 | -5.2 | -46.6 |
| භාණ්ඩ ටොන් කිලෝමීටර් (මිලියන) | 116 | 114 | -3.5 | -1.1 |
| මුළු ආදායම (රු. මිලියන) | 7,901 | 4,567 | 6.6 | -42.2 |
| මෙහෙයුම් වියදම (රු. මිලියන) | 15,464 | 14,618 | 7.5 | -5.5 |
| මෙහෙයුම් ලාභය (+)/ අලාභය (-) (රු. මිලියන) | -7,562 | -10,051 | 8.5 | 32.9 |
| 4. ශ්‍රීලංකන් ගුවන් සේවය | | | | |
| පියාසර කරන ලද පැය ගණන | 106,950 | 41,585 | -2.8 | -61.1 |
| මගී කිලෝමීටර් ප්‍රමාණය (මිලියන) | 15,509 | 3,641 | -4.1 | -76.5 |
| මගී ආසන පිරීමේ අනුපාතය (%) | 83 | 56 | -0.4 | -32.6 |
| බර පැටවීමේ අනුපාතය (%) | 74 | 62 | -1.2 | -16.8 |
| භාණ්ඩ ප්‍රවාහනය (මෙ.ටො. '000) | 123 | 56 | -9.5 | -54.3 |
| සේවා නියුක්තිය (සංඛ්‍යාව) | 6,709 | 6,489 | -2.0 | -3.3 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා දුම්රිය සේවය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

අගයක් විය. 2020 වසරේ මාර්තු සිට මැයි දක්වා කාලය තුළ දී භාණ්ඩ කිලෝමීටර ගණනෙහි සැලකිය යුතු පහළ යෑමක් වාර්තා වුව ද, වසරේ අවසාන භාගයේ දී භාණ්ඩ ප්‍රවාහනයෙහි දක්නට ලැබුණු යථා තත්ත්වයට පත්වීමත් සමඟ වසර තුළ දී භාණ්ඩ කිලෝමීටර ගණනෙහි සමස්ත පහළ යෑම සියයට 1.1කට සීමා විය.

**දුම්රිය මෙහෙයුම් පහළ යෑමේ බලපෑම පිළිබිඹු කරමින්, 2020 වසර තුළ දී ශ්‍රී ලං.දු.සේ.හි මූල්‍ය ක්‍රියාකාරිත්වය තවදුරටත් දුර්වල විය.** ශ්‍රී ලං.දු.සේ. 2019 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 7.6ක මෙහෙයුම් අලාභය හා සැසඳීමේ දී, 2020 වසරේ දී මෙහෙයුම් අලාභය රුපියල් බිලියන 10.1ක් දක්වා තවදුරටත් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් මගී ප්‍රවාහනයෙන් ඉපැයූ ආදායම සියයට 45.6කින් පහළ යෑම හේතුවෙන්, 2020 වසරේ දී ශ්‍රී ලං.දු.සේ.හි සමස්ත ආදායම සියයට 42.2කින් පහළ ගියේය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, මූලික වශයෙන් ප්‍රාග්ධන වියදමෙහි සිදු වූ සැලකිය යුතු ඉහළ යෑම හේතුවෙන් ශ්‍රී ලං.දු.සේ.හි සමස්ත වියදම සියයට 35.9කින් ඉහළ ගියේය. දුම්රිය ඒකක මිලදී ගැනීම සඳහා කරන ලද ගෙවීම් ඉහළ යෑම සහ මහව සිට ඕමන්තේ දක්වා වූ දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය හේතුවෙන් වසර තුළ දී ප්‍රාග්ධන වියදම් වැඩිවිය.


**රටේ කාර්යක්ෂම මගී හා භාණ්ඩ ප්‍රවාහනයක් සහතික කිරීම සඳහා ශ්‍රී ලං.දු.සේ. විසින් සිදුකරන ලද යටිතල පහසුකම් සංවර්ධන හා වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම්වලට කොවිඩ්-19 වසංගතය මගින් බාධා ඇති විය.** කෙසේ වෙතත්, මන්දගාමීව වුව ද, මෙම කාල සීමාව තුළ දී ශ්‍රී ලං.දු.සේ. විසින් සංවර්ධන හා වැඩිදියුණු කිරීමේ කටයුතු කිහිපයක් අඛණ්ඩව සිදු කරන ලදී. 2020 වසර තුළ දී මහව සිට ඕමන්තේ දක්වා වූ දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියෙහි කටයුතු අඛණ්ඩව සිදු වූ අතර, පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා සහ පයාගල දකුණ සිට අළුත්ගම දක්වා වූ දුම්රිය මාර්ග ද්විත්ව දුම්රිය මාර්ග බවට පත් කිරීම වසර තුළ දී ආරම්භ කෙරිණි. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය සහාය ඇතිව සංචාරක ආකර්ෂණීය ප්‍රදේශවල පිහිටා ඇති දුම්රිය ස්ථාන කිහිපයක් අලුත්වැඩියා කිරීම ඇතුළු දුම්රිය ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු වසර පුරා අඛණ්ඩව ක්‍රියාවට නැංවුණි. මේ අතර, සිය දුම්රිය ඒකක ප්‍රමාණය වැඩිදියුණු කිරීමේ අරමුණින්, ශ්‍රී ලං.දු.සේ. විසින් 2020 වසරේ දී දුම්රිය එන්ජින් දහයක්, සාමාන්‍ය බලවේග කට්ටල හයක්, උඩරට මාර්ගය සඳහා බලවේග කට්ටල නවයක්, භාණ්ඩ ප්‍රවාහන දුම්රිය ඒකක විස්සක් සහ ඉන්ධන ප්‍රවාහනයට යොදා ගන්නා දුම්රිය ඒකක තිහක් මිල දී ගන්නා ලදී. වායු සමනය කරන ලද බලවේග කට්ටල දෙකක් සහ මගී දුම්රිය මැදිරි 160ක් ඉන්දියාවෙන් මිල දී ගැනීම සඳහා වසර තුළ දී අත්තිකාරම් ගෙවන ලදී. මගී දුම්රිය මැදිරි 200ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩව කරගෙන ගිය අතර, ඒ අනුව 2020 වසරේ දී මගී දුම්රිය මැදිරි 50ක් නැවත සේවයට එක් කරනු ලැබුණි. මෙම ව්‍යාපෘතියෙහි පුළුල් කිරීමක් ලෙස අතිරේක මගී මැදිරි 100ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය. දුම්රිය

හරස් මාර්ගවල ආරක්ෂිතභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් නව හංගේරියානු ණය පහසුකම යටතේ ආරක්ෂිත හරස් මාර්ග පද්ධති 200ක් සඳහා ප්‍රසම්පාදන කටයුතු වසර තුළ දී සිදු කෙරිණි.

## සිවිල් ගුවන් සේවය

**කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය සමඟ විදේශ ගමන් හා සංචාරක කටයුතු විශාල වශයෙන් පහත වැටීම හේතුවෙන් 2020 වසරේ දී සිවිල් ගුවන් සේවා අංශයේ ක්‍රියාකාරිත්වය සැලකිය යුතු පසුබෑමකට ලක්විය.** කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය ගෝලීය ගුවන් සේවා කර්මාන්තය අඩපණ කළේය. ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයට අනුව, 2020 වසරේ දී ජාත්‍යන්තර මගී ප්‍රවාහන ඉල්ලුම සියයට 76කින් පමණ අඩු විය. දේශීයව, 2020 මාර්තු මැද සිට 2021 මුල් භාගය දක්වා ගුවන් තොටුපළවල් අඛණ්ඩව වසා දැමීම රටේ ගුවන් ගමන් කටයුතු කෙරෙහි සෘණාත්මක ලෙස බලපෑවේය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හරහා සිදු වූ මුළු ගුවන් යානා හැසිරවීම් සංඛ්‍යාව 24,931ක් දක්වා සියයට 65.4කින් සැලකිය යුතු ලෙස පහළ ගිය අතර, ඊට ජාත්‍යන්තර ගුවන් යානා හැසිරවීම් 20,437ක් සහ අභ්‍යන්තර ගුවන් යානා හැසිරවීම් 4,494ක් ඇතුළත් විය. 2020 වසරේ දී, වෙනත් ගුවන් යානා වෙත මාරු වන මගීන් ද ඇතුළුව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි මුළු ජාත්‍යන්තර මගී හැසිරවීම් සංඛ්‍යාව මිලියන 2.6ක් දක්වා සියයට 77.4කින් පහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළ බොහෝ ගුවන් සමාගම් සිය ගුවන් යානා භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගත්ත ද, වසර තුළ දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හරහා සිදු කරන ලද මුළු භාණ්ඩ හැසිරවීම් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 136,043ක් දක්වා සියයට 44.8කින් පහළ ගියේය. තවද, විදේශවල රැඳී සිටින පිරිස් නැවත මෙරටට ගෙන්වා ගැනීම සඳහා විකල්ප ගුවන් තොටුපළක් ලෙස භාවිත වූ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ මගින් 2020 වසරේ දී සිදු කරන ලද මගී හැසිරවීම් ප්‍රමාණය 15,482ක් සහ ගුවන් යානා හැසිරවීම් ප්‍රමාණය 505ක් විය. කොවිඩ්-19 ව්‍යාප්තියෙන් අනතුරුව, 2020 මාර්තු මැද සිට දෙසැම්බර් දක්වා කාලය තුළ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු සිදු නොවූ අතර, 2020 ඔක්තෝබර් මාසයේ දී අභ්‍යන්තර ගුවන් ගමන් සඳහා මෙහෙයුම් නැවත ආරම්භ කිරීමෙන් පසු මගීන් 20 දෙනෙකු රැගත් අභ්‍යන්තර ගුවන් යානා 4ක් ගුවන් තොටුපළ මගින් මෙහෙයවා ඇත. ඒ අනුව, 2020 වසරේ දී, යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි මුළු මගී හැසිරවීම් සහ ගුවන් ගමන් හැසිරවීම් සංඛ්‍යාව, පිළිවෙළින්, 3,502ක් සහ 140ක් ලෙස වාර්තා විය. තවද, රත්මලාන ගුවන් තොටුපළ සහ මඩකලපුව දේශීය ගුවන් තොටුපොළ මගින් සිදු කළ මුළු මගී හැසිරවීම් සංඛ්‍යාව, පිළිවෙළින්, සියයට 14.7කින් සහ සියයට 63.4කින් පහළ ගියේය. මේ වන තෙක් ගුවන් ගමන් යථා තත්ත්වයට පත් වීම මන්දගාමී වුව ද, ලොව පුරා එන්නත්කරණ කටයුතු ශීඝ්‍රයෙන් සිදු කිරීමත් සමඟ සංචාරකයින්ගේ අපේක්ෂාවන්හි අඛණ්ඩ වැඩිදියුණු වීමක් බලාපොරොත්තු වේ. ජෛව බුබුලු (bio bubble) සංකල්පය සමඟ, 2021 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකාවේ දේශ සීමා සංචාරකයින්ට නැවත විවෘත කිරීම තුළින් ගුවන් ගමන් කෙරෙහි යළි ඇති වූ නව උනන්දුවෙහි ප්‍රතිලාභ ලබා ගැනීමට රටට හැකි වනු ඇත. මේ අතර, ජාත්‍යන්තර නිර්දේශයන්ට අනුකූලව සෞඛ්‍ය හා ආරක්ෂණ ප්‍රතිපත්තිවලට ප්‍රමුඛතාවය දීමට ඇති කැපවීම ඇගයීම වෙනුවෙන් ජාත්‍යන්තර ගුවන් තොටුපළ කවුන්සිලය විසින් 2021 ජනවාරි මාසයේ දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත ප්‍රතීතන සහතිකයක් පිරිනමන ලදී. මෙම සහතිකය මගින් ශ්‍රී ලංකාව පිළිබඳ විදේශීය සංචාරකයින්ගේ සහ ගුවන් සමාගම්වල විශ්වාසය ඉහළ නැංවෙනු ඇති අතර, මෙම වසංගත තත්ත්වය තුළ ආරක්ෂිත සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ තත්ත්වය වඩාත් තහවුරු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**3.7 රූප සටහන**
**ගුවන් මගී හා ගුවන් භාණ්ඩ හැසිරවීම්**




මූලය: ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

3

3

**කොවිඩ්-19 ව්‍යාප්තිය සහ ඒ ආශ්‍රිත සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීම් හේතුවෙන්, 2020 වසරේ දී ගුවන් සේවා සංවර්ධන ව්‍යාපෘති කිහිපයක ප්‍රගතිය අඩාල විය.** බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ තුළ A පැකේජය යටතේ දෙවන පර්යන්තයක් ඉදිකිරීම සහ B පැකේජය යටතේ ගගනාංගනයේ ගුවන් යානා නවත්වන කොටස සහ ගුවන් යානා බැහැරුම් පථ ඉදිකිරීම ඇතුළත් ව්‍යාපෘතියක් ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් ආරම්භ කරන ලදී. මාස 36ක් තුළ නිම කිරීමට සැලසුම් කර ඇති A පැකේජය යටතේ වන ඉදිකිරීම් කටයුතු 2020 නොවැම්බර් මාසයේ දී ආරම්භ කෙරුණු අතර, සියයට 92ක ප්‍රගතියක් වාර්තා කර ඇති B පැකේජය යටතේ ඉදි කිරීම් කටයුතු 2021 වසරේ පළමු භාගය තුළ දී අවසන් කිරීමට නියමිතය. වාර්ෂිකව මෙට්‍රික් ටොන් 150,000ක අතිරේක ධාරිතාවයකින් යුත් ආනයන භාණ්ඩ හැසිරවීමේ පර්යන්තයක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ තුළ ඉදිකිරීමේ කටයුතු ද මේ වන විට සිදු වෙමින් පවතී. මේ අතර, කොළඹ නගරයට සුවිශේෂී ප්‍රවේශ මාර්ගයක් ලෙස රත්මලාන ගුවන් තොටුපළ සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රධාන සැලැස්මට (2018-2030) අදාළ කටයුතු 2020 වසරේ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි දැනට පවතින මගී පර්යන්ත ගොඩනැගිල්ලේ ධාරිතාවය පුළුල් කිරීම සඳහා එය ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම මෙන්ම, රථවාහන අධික අවස්ථාවල දී තදබදය අවම කිරීම සඳහා එම ගුවන් තොටුපළ සඳහාම වෙන් වූ ප්‍රවේශ මාර්ගයක් සංවර්ධනය කිරීම සඳහා ද ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම කටයුතු කළේය. කොවිඩ්-19 වසංගතය පිළිබඳව සලකා බලා ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් අනෙකුත් රාජ්‍ය ආයතන සමග ඒකාබද්ධව සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාවට නංවන ලදී. මගීන්ට සහ ගුවන් සමාගම්වලට සම්මත මෙහෙයුම් පටිපාටි නිකුත් කිරීම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ පරිශ්‍රය තුළ පී.සී.ආර්. රසායනාගාරයක් ස්ථාපිත කිරීම හා ශරීර උෂ්ණත්ව පරීක්ෂණ ස්කෑනර් යන්ත්‍රයක් සවි කිරීම මෙන්ම සංක්‍රමණික සේවකයින් නැවත මෙරටට ගෙන්වා ගැනීම සඳහා විශේෂ ගුවන් ගමන් සඳහා පහසුකම් සැලසීම යනාදිය මෙයට ඇතුළත් විය.

**කොවිඩ්-19 වසංගතය හා සම්බන්ධ සංචරණ සීමා මගින් ශ්‍රීලංකන් ගුවන් සේවයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කර ඇත.** තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ශ්‍රීලංකන් ගුවන් සේවය, පාස්කු ඉරිදා ප්‍රහාරවල බලපෑමට ලක් වූ 2019 වසරේ අප්‍රේල් සිට 2020 ජනවාරි දක්වා කාලය තුළ දී වාර්තා කළ රුපියල් බිලියන 13.9ක අලාභය හා සැසඳීමේ දී, 2020 අප්‍රේල් සිට 2021 ජනවාරි දක්වා කාලය තුළ රුපියල් බිලියන 30.9ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය. සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රීලංකන් ගුවන් සේවයේ ආදායම සියයට 75.9ක කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කළ අතර, මෙහෙයුම් වියදම සියයට 58.4කින් පහළ ගියේය. ශ්‍රීලංකන් ගුවන් සේවයේ මූල්‍ය කාර්ය සාධනය මත කොවිඩ්-19 වසංගතයේ බලපෑම අවම කිරීමේ අරමුණින්, ගුවන් යානා මෙහෙයුම් කල්බදු කොන්ත්‍රාත් පිළිබඳව නැවත සාකච්ඡා කිරීම, සේවකයින් සම්බන්ධ පිරිවැය අඩු කිරීම, ගිවිසුම්ගත බැඳීම් සම්බන්ධයෙන් නැවත සාකච්ඡා කිරීම සහ අත්‍යවශ්‍ය නොවන සේවා පිළිබඳ කොන්ත්‍රාත්තු අත්හිටුවීම මෙන්ම ඉන්ධන මිල පිළිබඳ නැවත සාකච්ඡා කිරීම ඇතුළු පිරිවැය අඩු කිරීමේ ක්‍රියාමාර්ග කිහිපයක් ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් ආරම්භ කරන ලදී. 2020 වසර තුළ දී, නව අවශ්‍යතා සපුරාලීම සඳහා කුලී ගමන් සේවා ද සිදු කරන අතරතුර, ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් ලොව පුරා විසිර සිටින ශ්‍රී ලාංකිකයන් නැවත මෙරටට ගෙන්වා ගැනීමේ කටයුතුවල ද නිරත විය. ඒ අනුව, 2020 අප්‍රේල් මස 01 දින සිට 2021 ජනවාරි මස 10 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී ගුවන් ගමන් 159ක් හරහා මගීන් 39,583ක් ආපසු රැගෙන එන ලදී. අපනයන කටයුතු සඳහා පහසුකම් සැලසීමේ අරමුණින්, ශ්‍රීලංකන් ගුවන් සේවයේ භාණ්ඩ මෙහෙයුම් කටයුතු පුළුල් කෙරුණු අතර, එහි වර්තමාන භාණ්ඩ ප්‍රවාහන ජාලය ගමනාන්ත 18කින් සමන්විත වේ.

## වරාය සේවා

**දේශීයව කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය සහ ජාත්‍යන්තර සැපයුම් දාමයන්ට ඇති වූ අවහිරතා හේතුවෙන් වරාය අංශයේ ක්‍රියාකාරකම්වල පසුබෑමක් පෙන්නුම් කළ ද, වසර අවසානය වන විට එය තරමක් දුරට යථා තත්ත්වයට පත් විය.** 2020 වසර ආරම්භයේ දී ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළ ද, වසංගතය මගින් වරාය කටයුතුවලට ඇති වූ සෘණාත්මක බලපෑම 2020 වසරේ මාර්තු මාසය සහ දෙවන කාර්තුව පුරාම දක්නට ලැබුණි. කෙසේ වෙතත්, තෙවන කාර්තුවේ දී වරාය ක්‍රියාකාරකම්වල ප්‍රගතියක් දක්නට ලැබුණු අතර, සංචරණ සීමා ලිහිල් කිරීමෙන් පසුව බහලු සහ භාණ්ඩ මෙහෙයුම් දෙ අංශයම ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, ඔක්තෝබර් මස මුල දී වසංගතයේ දෙවන රැල්ල පැතිර යාමත් සමඟ, ප්‍රධාන

වශයෙන්ම කොළඹ වරායේ කාර්ය මණ්ඩලය අතරින් කොවිඩ්-19 රෝගීන් විශාල පිරිසක් හමු වීම හේතුවෙන් වසරේ අවසන් කාර්තුවේ දී වරාය අංශයේ ක්‍රියාකාරකම් කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති විය. මෙම සියලු සාධකවල ඒකාබද්ධ බලපෑම හේතුවෙන් කොළඹ වරායේ බහලු මෙහෙයුම් සහ භාණ්ඩ මෙහෙයුම් 2020 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පසුබෑමකට ලක් වූ අතර, පැමිණි නැව් සංඛ්‍යාවේ ද අඩු වීමක් දක්නට ලැබුණි. ප්‍රතිනැව්ගත කිරීම් ද ඇතුළුව, කොළඹ වරායේ සියලු පර්යන්තවල බහලු මෙහෙයුම් කටයුතු පසුබෑමට ලක් විය. කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය (කො.ජා.බ.ප.), ශ්‍රී ලංකා වරාය අධිකාරිය (ශ්‍රී ලං.ව.අ.) සහ දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (ද.ආ.පි.ප.) මගින් කොළඹ වරායේ සමස්ත බහලු ධාරිතාවයෙන්, පිළිවෙළින්, සියයට 42.1, සියයට 30.6, සියයට 27.3කට දායකත්වයක් දැක්වීය. ශ්‍රී ලං.ව.අ. සහ ද.ආ.පි.ප.හි භාණ්ඩ මෙහෙයුම් ප්‍රමාණයේ පසුබෑමක් පෙන්නුම් කළ ද, කො.ජා.බ.ප. සියයට 0.6ක සුළු වර්ධනයක් වාර්තා කළේය.

**3.6 සංඛ්‍යා සටහන**

**වරාය සේවා ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2019 | 2020 (අ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2019 | 2020(අ) |
| 1. පැමිණි නැව් සංඛ්‍යාව | 4,697 | 4,337 | -3.6 | -7.7 |
| කොළඹ | 4,198 | 3,806 | -3.1 | -9.3 |
| ගාල්ල | 43 | 22 | -48.8 | -48.8 |
| ත්‍රිකුණාමලය | 142 | 135 | -24.9 | -4.9 |
| හම්බන්තොට | 314 | 374 | 16.3 | 19.1 |
| 2. මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙ.ටො. '000) | 106,979 | 102,908 | 1.9 | -3.8 |
| කොළඹ | 101,926 | 97,681 | 1.8 | -4.2 |
| ද.ආ.පි.ප. | 26,515 | 24,878 | -2.0 | -6.2 |
| කො.ජා.බ.ප. | 37,089 | 37,310 | 9.4 | 0.6 |
| ශ්‍රී ලං.ව.අ. | 38,322 | 35,493 | -2.3 | -7.4 |
| ගාල්ල | 510 | 404 | -30.1 | -20.8 |
| ත්‍රිකුණාමලය | 3,304 | 3,072 | -7.2 | -7.0 |
| හම්බන්තොට | 1,239 | 1,750 | 151.0 | 41.2 |
| 3. බහලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) (ආ) | 7,228 | 6,855 | 2.6 | -5.2 |
| ද.ආ.පි.ප. | 2,052 | 1,872 | -0.7 | -8.8 |
| කො.ජා.බ.ප. | 2,894 | 2,885 | 8.1 | -0.3 |
| ශ්‍රී ලං.ව.අ. | 2,283 | 2,098 | -1.0 | -8.1 |
| 4. බහලු ප්‍රතිනැව්ගත කිරීම් (TEUs '000) (ආ) | 5,955 | 5,765 | 6.3 | -3.2 |
| ද.ආ.පි.ප. | 1,651 | 1,607 | -2.1 | -2.7 |
| කො.ජා.බ.ප. | 2,296 | 2,291 | 12.5 | -0.2 |
| ශ්‍රී ලං.ව.අ. | 2,008 | 1,867 | 1.6 | -7.0 |

(අ) තාවකාලික
(ආ) TEUs = අඩි විස්සට සමාන බහලු ඒකක
(ඇ) නැවත ගබඩා කිරීම් ද ඇතුළත් ව

මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය


නැගෙනහිර බහලු පර්යන්තයේ (නැ.බ.ප.) පළමු තොටුපොළ බැම්මේ මෙහෙයුම් කටයුතු 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී ආරම්භ කරන ලද අතර, 2020 වසරේ දෙසැම්බර් අවසානය වන විට නැ.බ.ප. විසින් අඩි විස්සේ බහලු ඒකක 41,741කට සමාන බහලු ප්‍රමාණයක් හසුරවන ලදී.

2020 වසරේ දී හම්බන්තොට වරායේ රථ වාහන මෙහෙයුම් සැලකිය යුතු ලෙස පසුබෑමට ලක් වුව ද, කොළඹ වරායේ කොවිඩ්-19 ව්‍යාප්තියත් සමඟ එහි සිට හම්බන්තොට වරායට ඇතැම් යාත්‍රා හරවා යැවීමට සිදු වීම හේතුවෙන් එහි භාණ්ඩ මෙහෙයුම්වල සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් ඇති විය. විශේෂයෙන්ම, දේශීය රථ වාහන මෙහෙයුම් ප්‍රමාණය 16,896ක් දක්වා සියයට 51.8කින් පහළ යෑම හේතුවෙන් හම්බන්තොට වරාය තුළ හසුරවන ලද සමස්ත රථ වාහන සංඛ්‍යාව 352,917ක් දක්වා සියයට 14.3කින් පහළ ගියේය. රථ වාහන ආනයනය සීමා කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හම්බන්තොට වරායේ රථ වාහන මෙහෙයුම්වල පහළ යෑමට හේතු විය. මේ අතර, 2020 වසරේ දී හම්බන්තොට වරායේ ප්‍රතිනැව්ගත කිරීමේ අරමුණ ඇතිව සිදු කරනු ලැබූ රථ වාහන මෙහෙයුම් ප්‍රමාණය 336,021ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 10.8කින් පහළ ගියේය.

කොවිඩ්-19 වසංගතය සහ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් යම් පසුබෑමක් ඇති වුව ද, රටේ ප්‍රධාන වරායන්වල යටිතල පහසුකම් පුළුල්

**3.8 රූප සටහන**

**බහලු මෙහෙයුම්, ප්‍රතිනැව්ගත කිරීම් සහ නැව් පැමිණීම්**




මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

3

**3.9 රූප සටහන**
**වරාය ක්‍රියාකාරකම් වල ක්‍රියාකාරිත්වය**




මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය



කිරීම සඳහා රජය 2020 වසරේ දී ද අඛණ්ඩව ප්‍රයත්න දැරීය. උතුරු කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය 2020 වසරේ දී සිදු කරන ලදී. කන්කසන්තුරේ වරාය සංවර්ධනය සහ පුළුල් කිරීම සඳහා වූ පාරිසරික බලපෑම් තක්සේරු කිරීම 2020 වසරේ දී අවසන් කරන ලද අතර, මෙම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කරගැනීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය. තවද, ත්‍රිකුණාමලය වරායේ අෂ්රොෆ් ජැටිය පුළුල් කිරීම සඳහා වූ මූල්‍ය ශක්‍යයතා අධ්‍යනය වසර තුළ දී අවසන් කරන ලදී. නැ.බ.ප. සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ යෝජිත විදේශ හවුල්කාරිත්වය සම්බන්ධයෙන් වූ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලින් පසුව, නැ.බ.ප. සම්පූර්ණයෙන්ම ශ්‍රී ලං.ව.අ. සතු පර්යන්තයක් ලෙස මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා 2021 පෙබරවාරි මාසයේ දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය. තවද, වසර 35කින් නැවත භාරදීමේ පදනම යටතේ, ඉන්දියානු සහ ජපාන රජයයන් විසින් නම් කරන ලද පාර්ශ්ව සහ ශ්‍රී ලං.ව.අ. අතර වූ හවුල්කාරිත්වයක් වශයෙන් කොළඹ වරායේ බටහිර බහලු පර්යන්තය සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය හිමි විය.

වරාය කටයුතුවල පසුබෑමක් දක්නට ලැබුණ ද, 2020 වසරේ දී ශ්‍රී ලං.ව.අ.හි මූල්‍ය කාර්ය සාධනයේ වර්ධනයක් ඇති විය. ශ්‍රී ලං.ව.අ.හි සමස්ත ආදායම රුපියල් බිලියන 38.9ක් දක්වා සියයට 4.5කින් පහළ ගිය අතර, මෙහෙයුම් වියදම ද රුපියල් බිලියන 29.7ක් දක්වා සියයට 20.6කින් පහළ ගියේය. ඒ අනුව, 2019 වසරේ රුපියල් බිලියන 16.2ක් වූ ශ්‍රී ලං.ව.අ.හි බදුවලට පෙර ලාභය 2020 වසරේ දී රුපියල් බිලියන 20.3ක් ලෙස වාර්තා විය.

## පණිවුඩ හුවමාරු සේවා

**කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය මැඩපැවැත්වීම සඳහා පනවන ලද සංචරණ සීමා සහ සෞඛ්‍ය රෙගුලාසි මධ්‍යයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් රැසක් අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා මූලික පදනම මෙරට විදුලි සංදේශ අංශය මගින් සැපයිණි.** දිවයින පුරා ක්‍රියාත්මක වූ සංචරණ සීමා සහ පුද්ගල සහභාගීත්වය සීමා කිරීමට පනවන ලද මහජන සෞඛ්‍ය හා සම්බන්ධ විධි විධාන අතර වුව ද, විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන් විසින් ලබා දෙන ලද නව්‍ය සේවා හේතුවෙන් බැංකු, සෞඛ්‍ය, අධ්‍යාපන, සිල්ලර වෙළඳාම හා රාජ්‍ය පරිපාලනය වැනි ප්‍රධාන අංශ කිහිපයක ක්‍රියාකාරකම් සැලකිය යුතු තරමකට අඛණ්ඩව පවත්වාගෙන යෑමට හැකිවිය. භෞතික ක්‍රමවේදවලින් (physical platforms) බැහැර වීමේ ක්ෂණික අවශ්‍යතාවත්, එමගින් විදුලි සංදේශ සේවා සඳහා ඉල්ලුම ඉහළ යෑමත් හේතුවෙන් දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, ජංගම දුරකථන සම්බන්ධතා සංඛ්‍යාවෙහි අඩුවීමක් දක්නට ලැබුණි.

**නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමවේදය හඳුන්වාදීම සහ සංචරණ සීමා පැනවීමත් සමඟ අන්තර්ජාල භාවිතයේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි.**

**3.7 සංඛ්‍යා සටහන**
**විදුලි සංදේශ අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2019(අ) | 2020(ආ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2019(අ) | 2020(ආ) |
| 1. ස්ථාවර දුරකථන සේවා ('000) | 2,300 | 2,613 | -7.4 | 13.6 |
| රැහැන් සහිත දුරකථන සංඛ්‍යාව | 1,245 | 1,246 | 2.4 | 0.1 |
| රැහැන් රහිත දුරකථන සංඛ්‍යාව | 1,055 | 1,367 | -16.8 | 29.6 |
| 2. ජංගම දුරකථන සංඛ්‍යාව ('000) | 32,884 | 28,739 | 1.1 | -12.6 |
| 3. අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව (ඇ) | 13,408 | 17,524 | 26.9 | 30.7 |
| 4. පොදු දුරකථන කුටි සංඛ්‍යාව | 476 | 461 | -77.7 | -3.2 |
| 5. ඝනත්වය (ඈ) | | | | |
| ස්ථාවර දුරකථන | 10.5 | 11.9 | -8.0 | 13.0 |
| ජංගම දුරකථන | 150.8 | 131.1 | 0.5 | -13.1 |
| අන්තර්ජාලය (ඇ) | 61.5 | 79.9 | 26.2 | 30.0 |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජංගම අන්තර්ජාල සම්බන්ධතා ඇතුළත්ව
(ඈ) පුද්ගලයින් 100කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව ලෙස අර්ථ දැක්වේ.

මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වසංගත තත්ත්වය මධ්‍යයේ පුද්ගලයින් බොහෝ දුරට ඔවුන්ගේ වාසස්ථානවලට සීමා වීම හේතුවෙන්, කාර්යාලීය, අධ්‍යාපන, භාණ්ඩ මිලදී ගැනීම්, බැංකු හා විනෝදාස්වාද යන කටයුතු සඳහා අන්තර්ජාල භාවිතය සැලකිය යුතු ලෙස වැඩි විය. ඒ අනුව, 2020 වසරේ දී ජංගම හා ස්ථාවර අන්තර්ජාල සම්බන්ධතා ඇතුළත් සමස්ත අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව සියයට 30.7කින් වර්ධනය විය. දත්ත භාවිතය වසර පුරා අඛණ්ඩව වර්ධනය වූ අතර, දිවයින පුරා ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබූ මාර්තු සහ අප්‍රේල් මාසවල දී දත්ත භාවිතයේ තියුණු ඉහළ යෑමක් ද, ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල දී පැනනැඟී දෙවන රැල්ල අතරතුර එහි දෙවන උච්ච අවස්ථාව ද දක්නට ලැබුණි. සිව්වන පරම්පරාවේ සිට පස්වන පරම්පරාව වෙත සේවා පරිවර්තනයකට විදුලි සංදේශ අංශය සූදානම් වෙමින් සිටිය ද, ශ්‍රී ලංකාවේ අන්තර්ජාල සේවාවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් පවතී. පවත්නා ජාල යටිතල පහසුකම් මත අඛණ්ඩව ආයෝජනය කිරීම මගින් ගුණාත්මකභාවය සම්බන්ධයෙන් දැනට පවතින ගැටලු විසඳීම සඳහා සහාය විය හැක. ආර්ථිකයේ ඩිජිටල්කරණය වීමේ වේගය ඉහළ යමින් පවතින බැවින් එය අත්‍යවශ්‍ය සාධකයක් වනු ඇත.

**වසංගත තත්ත්වය මධ්‍යයේ වැඩි දියුණු වූ විදුලි සංදේශ සේවා පැවතීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් 2020 වසර තුළ දී මෙම අංශය සඳහා පූර්වෝපායිකව මග පෙන්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී.** සිව්වන පරම්පරාවේ සම්බන්ධතා/බ්‍රෝඩ්බෑන්ඩ් ආවරණ සම්බන්ධයෙන් සේවා පහසුකම් නොමැති සහ ඌන සේවා පහසුකම් පවතින ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය ආරම්භ කළේය. තවද, නිවසේ සිට වැඩ කිරීම සහ නිවසේ සිට අධ්‍යයන කටයුතු කිරීම සඳහා දැරිය හැකි මිලකට ලබාගත හැකි අන්තර්ජාල දත්ත ප්‍රමාණය සඳහා වැඩිවන ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, වසංගත කාලය තුළ දී විවිධ සේවා සපයන්නන්ගේ විශේෂ ගාස්තු සැලසුම් කිහිපයක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. කෙසේ වෙතත්, අන්තර්ජාල සහ බ්‍රෝඩ්බෑන්ඩ් ආවරණය නොමැති වීම නිසා සමහර දුෂ්කර පළාත්වල ජීවත් වන පාසල් සිසුන්ට මාර්ගගත ඉගෙනුම් සැසිවලට සහභාගී වීමේ දී විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු විය. මේ ගැටලු විසඳීම සඳහා රජයේ දීප ව්‍යාප්ත ඩිජිටල්කරණ වැඩසටහන හරහා පියවර ගැනීම අවශ්‍ය වේ. ආර්ථිකයේ වෙනස්වන අවශ්‍යතාවලට සරිලන පරිදි, සේවා සපයන්නා මාරු කළ ද පරිශීලකයාට ජංගම දුරකථන අංකය නොවෙනස්ව භාවිත කිරීමේ හැකියාව ලබා දීම, සීමා රහිතව අන්තර්ජාල පහසුකම් සැලසෙන පැකේජ වැනි නව හඳුන්වාදීම් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන්


**3.11 රූප සටහන**
**බ්‍රෝඩ්බෑන්ඩ් දත්ත භාවිතය**




මූලයන්: ඩයලොග් ඇක්සියාටා පොදු සීමිත සමාගම
ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සීමිත සමාගම
මොබිටෙල් (පෞද්.) සමාගම
භාර්ති එයාර්ටෙල් ලංකා (පෞද්.) සමාගම

සටහන: පෙටාබයිට් 1 = ගිගාබයිට් මිලියන 1

**3.10 රූප සටහන**
**දුරකථන ඝනත්වය**




මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සභාව මූලික වූ අතර, මෙම වැඩසටහන් 2021 වසරේ දී ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ ඩිජිටල් යටිතල පහසුකම් පදනම වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ව්‍යාපෘති කිහිපයක් ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් අතරට, ලංකා රාජ්‍ය ජාලය 2.0, ලංකා රාජ්‍ය ක්ලවුඩ් 2.0, ඩිජිටල් සෞඛ්‍ය ව්‍යාපෘතිය සහ කර්මාන්ත සංවර්ධන වැඩසටහන ඇතුළත් විය. තවද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, වෙනත් ආයතනවල සහාය ද සහිතව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය සඳහා වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම් (meet.gov.lk), කොවිඩ්-19 ආසාදිතයින්ගේ ආශ්‍රිතයින් සොයා ගැනීම සඳහා වූ මංගත මෙවලම (staysafe.lk), වෛද්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද දත්ත ඇතුළත් ජංගම දුරකථන යෙදවුම (MyHealth යෙදවුම), රජයේ සහාය අවශ්‍ය විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සඳහා වූ වෙබ් අඩවිය (www.contactsrilanka.mfa.gov.lk) සහ කොවිඩ්-19 ආශ්‍රිත තොරතුරු නිකුත් කිරීම සඳහා වූ ජාතික වෙබ් අඩවිය (www.covid19.gov.lk) ස්ථාපනය කළේය.

**තාක්ෂණය පදනම් කරගත් සමාජයක් ස්ථාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති උපායමාර්ගයට, අනුකූලව, ඩිජිටල් රජයක්, ඩිජිටල් ආර්ථිකයක් සහ ඩිජිටල් සේවා ස්ථිරසාරව ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය පියවර කිහිපයක් රජය විසින් ක්‍රියාත්මක කරන ලදී.** ඒ අනුව, ඊ-ග්‍රාම නිලධාරි ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා ඩිජිටල් ආර්ථික උපායමාර්ගය සහ සිසුන්ගේ හා ගුරුවරුන්ගේ ඩිජිටල් සාක්ෂරතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ද ඇතුළුව තවත් ව්‍යාපෘති කිහිපයක් වසර තුළ දී ක්‍රියාත්මක විය. මේ අතර, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ඩිජිටල් සහතික ප්‍රදානය කිරීම, කළමනාකරණය සහ බලාත්මක කිරීම සඳහා වූ නෛතික, පරිපාලන හා තාක්ෂණික රාමුවට පහසුකම් සැලසීමේ අරමුණින් සහතික කිරීම සඳහා වූ ජාතික අධිකාරියක් පිහිටුවන ලදී.

**කොවිඩ්-19 වසංගතය හේතුවෙන් තැපැල් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් 2020 වසර මුළුල්ලේම පසුබෑමකට ලක් විය.** කොවිඩ්-19 වසංගතය සම්ප්‍රේෂණය වීම පාලනය කිරීමට රජය විසින් වසර තුළ දී පුද්ගල සංචරණය සහ භාණ්ඩ ප්‍රවාහන සීමා පැනවීම තැපැල් සේවා කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති කළේය. ජාත්‍යන්තර තැපැල් ජාලවල බිඳවැටීම් ද තැපැල් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වයට බාධා එල්ල කළේය. මෙම අවහිරතා මධ්‍යයේ, රජයේ රෝහල්වල සායනවල ලියාපදිංචි රෝගීන්ට අවශ්‍ය ඖෂධ ලබා දීම සඳහා වූ ක්‍රමවේදයක් තැපැල් දෙපාර්තමේන්තුව විසින් ස්ථාපනය කරන ලදී. තවද, තැපැල් දෙපාර්තමේන්තුව විසින් රජයේ විශ්‍රාම වැටුප්, ගොවි විශ්‍රාම වැටුප්, වැඩිහිටි සහ වෙනත් සමාජ ප්‍රතිලාභී දීමනා ගෙවීම් කටයුතු සඳහා අඛණ්ඩව පහසුකම් සපයන ලදී. ප්‍රධාන තැපැල් කාර්යාල 653ක්, උප තැපැල් කාර්යාල 3,409ක් සහ නියෝජිත තැපැල් කාර්යාල 134ක් හරහා තැපැල් දෙපාර්තමේන්තුව විසින් මෙම සේවා සපයන ලදී. සමස්තයක් ලෙස, 2020 වසරේ දී තැපැල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය දුර්වල මට්ටමක පැවතුණි. තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2020 වසරේ දී තැපැල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අලාභය, 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 5.3ට සාපේක්ෂව රුපියල් බිලියන 7.7ක් විය. මෙය, 2020 වසර තුළ දී ආදායම රුපියල් බිලියන 6.4ක් දක්වා සියයට 24.2කින් අඩුවීම සහ මෙහෙයුම් වියදම් රුපියල් බිලියන 14.0ක් දක්වා සියයට 2.2කින් ඉහළ යෑමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. ඉහළ යන වියදම් හා සැසඳීමේ දී ආදායම වර්ධනය නොවීම පිළිබඳව නිසි අවධානය යොමු කරමින්, ආදායම් උත්පාදනය කිරීමේ ඵලදායී මාර්ග නිර්මාණය කිරීමේ උපායමාර්ග ඇතුළත් ව්‍යාපාර සංවර්ධන සැලැස්මක් තැපැල් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී. ආර්ථිකයේ අවශ්‍යතා සහ ක්‍රියාකාරකම්වල වෙනස් වන ස්වභාවය සැලකිල්ලට ගනිමින්, කුරියර් සේවා සඳහා වැඩිවන ඉල්ලුමේ ප්‍රතිලාභ අත් කර ගැනීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ දේශීය හා ජාත්‍යන්තර සේවා නොපමාව නවීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

## ජල සම්පාදනය හා වාරිමාර්ග

**සමස්ත මහජනතාවට පිරිසිදු හා ආරක්ෂිත පානීය ජලය ලබාදීම සහතික කිරීම සඳහා වූ රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාව අනුව යමින්, නල ජලය සඳහා ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා 2020 වසරේ දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අඛණ්ඩව කටයුතු කළේය.** කොවිඩ්-19 ආශ්‍රිත බාධා පැවතිය ද, වසර තුළ දී ජාතික ජලාපවහන මණ්ඩලය විසින් නව ජල සම්බන්ධතා 122,733ක් ලබා දුන් අතර, ඒ අනුව 2020 වසර අවසානය වන විට පැවති සමස්ත නල ජල සම්බන්ධතා ප්‍රමාණය මිලියන 2.6ක් විය. තවද, ශ්‍රී ලංකාව තුළ ආරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය, පෙර වසරේ පැවති සියයට 91.9ක මට්ටමේ සිට 2020 වසරේ දී සියයට 93.2ක් දක්වා ඉහළ ගියේය. රටේ ආදායම් නූපදවන

ජල භාවිතය, 2019 වසරේ වාර්තා වූ සියයට 25.1ක අගයේ සිට 2020 වසරේ දී සියයට 24.6ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය. මේ අතර, පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 1.2ක මූල්‍ය අලාභය හා සැසඳීමේ දී, 2020 වසර තුළ දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය රුපියල් මිලියන 532.9ක ශුද්ධ ලාභයක් වාර්තා කළේය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සමස්ත ආදායම ඉහළ යෑම මේ සඳහා වැඩි වශයෙන් දායක විය. ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආරක්ෂිත පානීය ජල පහසුකම් සඳහා ප්‍රවේශය ඉහළ නැංවීමට වසර තුළ දී ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාවට නංවන ලදී. ඒ අනුව, රුවන්වැල්ල, බුලත්කොහුපිටිය සහ යටියන්තොට යන ප්‍රදේශවල ජීවත්වන 35,000ක් පමණ ජනතාවකට ආරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීමේ අරමුණින් යුතුව 2020 වසරේ දී රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මේ අතර, 2017 වසරේ ආරම්භ කරන ලද කැලණි දකුණු ඉවුරේ ජල සැපයුම් ව්‍යාපෘතිය II වසර තුළ දී අවසන් කෙරිණි. මෙම ව්‍යාපෘතිය හරහා විශේෂයෙන්ම, කැලණිය, කඩවත, වත්තල, පෑලියගොඩ, මහර, රාගම, බියගම, වැලිසර, කඳාන, ජාඇල, පමුණුගම සහ ඒකල වැනි නාගරික ප්‍රදේශවල ඉහළ යන ජල ඉල්ලුම සපුරාලීම සඳහා පානීය ජල පහසුකම් සැපයීම ඉලක්ක කෙරේ. මෙවැනි ප්‍රයත්න

**3.8 සංඛ්‍යා සටහන**

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය**

| ශීර්ෂය | 2019 | 2020(අ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2019 | 2020(අ) |
| මුළු ජල සම්පාදන යෝජනා ක්‍රම ගණන (ආ) | 348 | 331 | - | -4.9 |
| වසර තුළ දී සපයන ලද නව ජල සම්බන්ධතා ගණන | 108,850 | 122,733 | -0.6 | 12.8 |
| සපයා ඇති මුළු ජල සම්බන්ධතා ගණන (ආ) | 2,437,504 | 2,560,237 | 4.7 | 5.0 |
| මුළු ජල නිෂ්පාදනය (ඝන මීටර් මිලියන) | 746 | 782 | 5.5 | 4.8 |
| ආදායම් නූපදවන ජලය (%) | | | | |
| කොළඹ නගරය | 40.6 | 39.2 | -2.6 | -3.4 |
| සමස්ත දිවයින | 25.1 | 24.6 | 0.5 | -1.7 |
| පිරිසිදු පානීය ජල පහසුකම් සඳහා ප්‍රවේශය (ප්‍රතිශතය) (ඇ) | 91.9 | 93.2 | 1.4 | 1.4 |
| නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය (ප්‍රතිශතය) (ඈ) | 51.8 | 53.1 | 2.6 | 2.5 |

(අ) තාවකාලික

මූලය: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

(ආ) වසර අවසානයේ දී

(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2016 මත පදනම් වූ සංසන්දනාත්මක අගය සියයට 88.8 ක් වේ.

(ඈ) අනෙකුත් බලයලත් ආයතන මගින් කළමනාකරණය කරනු ලබන පද්ධති ද ඇතුළත්ව

දරුව ද, පානීය නල ජලය නොමැතිකමින් ඇතැම් පිටිසර ප්‍රදේශ බොහෝ දුෂ්කරතාවලට අඛණ්ඩව මුහුණ දෙයි. යාපනය සහ කිලිනොච්චි යන ප්‍රදේශවල ජල සැපයුම් සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය වසර තුළ දී ක්‍රියාත්මක විය. යාපනය නගරය, එයට තදාසන්න ප්‍රදේශ සහ යාපනය අර්ධද්වීපයේ අනෙකුත් කුඩා නගරවල ජීවත්වන 689,000ක ජනතාව සඳහා ආරක්ෂිත පානීය ජල පහසුකම් වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුවේ. මීට අමතරව, මාතලේ දිස්ත්‍රික්කය මුහුණ පා සිටින පානීය ජලයෙහි අඩු ගුණාත්මකභාවය සහ නල ජල සැපයුමෙහි ව්‍යාප්තිය පහළ මට්ටමක පැවතීම යන ගැටලු විසඳීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කෙරෙන මහ මාතලේ ජල සැපයුම් ව්‍යාපෘතිය 2020 වසර තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, 2021 වසර වන විට මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

3


**වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වාරි සම්පාදන සහ අනිකුත් ගෘහස්ත අවශ්‍යතා සඳහා ජල සම්පත් තිරසාරව කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා වූ සිය ක්‍රියාමාර්ග 2020 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වාරිමාර්ග ව්‍යාපෘති 25ක් 2020 වසරේ දී ක්‍රියාත්මක විය. වසර තුළ දී වාරිමාර්ග ව්‍යාපෘති සඳහා වැය කළ සමස්ත වියදම රුපියල් බිලියන 6.7ක් වූ අතර, ඉන් බිලියන 5.4ක් යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා මෙම වසර තුළ දී යොදවා ඇත. උමා ඔය පහළ ගංගාධාර ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතිය 2020 වසර අවසානයේ දී සියයට 91.5ක් විය. දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමට ජල සම්පත් යටිතල පහසුකම්වලට ඇති හැකියාව වැඩි දියුණු කිරීමේ අරමුණින් යුතුව සැලසුම් කරන ලද 2014 සිට 2019 දක්වා ක්‍රියාත්මක වීමට නියමිත වූ පස් අවුරුදු ව්‍යාපෘතියක් වන දේශගුණික බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය 2020 වසර දක්වා දීර්ඝ කෙරිණි. මෙම ව්‍යාපෘතිය සඳහා අනුමත පිරිවැය රුපියල් මිලියන 5,736.5ක් වන අතර, 2020 අවසානය වන විට ඉන් රුපියල් මිලියන 4,038.7ක් වියදම් කර තිබුණි. 2017 වසරේ ආරම්භ කරන ලද, ඵලදායිතාව නැංවීම සහ වාරිමාර්ග පද්ධතිවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය, කොවිඩ්-19 ආශ්‍රිත අවහිරතා මධ්‍යයේ 2020 වසර තුළ දී මන්දගාමීව වුව ද ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය මගින් රටේ වාරිමාර්ග යෝජනා ක්‍රම 80ක ඉඩම්, ජලය හා භෝග ඵලදායිතාව ඉහළ නැංවීම අරමුණු කෙරේ.

## 3.3 සමාජ යටිතල පහසුකම් පිළිබඳ ප්‍රතිපත්ති, ආයතනික රාමුව සහ ක්‍රියාකාරිත්වය

### සෞඛ්‍ය

**කොවිඩ්-19 වසංගත ව්‍යාප්තියේ පළමු රැල්ල සහ දෙවන රැල්ල මැඩ පැවැත්වීමේ දී ශ්‍රී ලංකාව දැඩි අභියෝගවලට මුහුණ දුන් නමුත්, සෞඛ්‍ය අංශයේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ඒකාබද්ධ ක්‍රියාමාර්ග හේතුවෙන් 2020 වසරේ දී රෝගීන් ගණන පාලනය කළ හැකි මට්ටමක පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය.** 2020 ජනවාරි මාසයේ දී පළමු කොවිඩ්-19 ආසාදිත රෝගියා හඳුනා ගැනීමත් සමඟ, රට තුළට ඇතුළු වන ස්ථානවල දී පරීක්ෂා කිරීම, කොවිඩ්-19 පරීක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම, සියලු ආසාදිත පුද්ගලයින් හුදකලා කිරීම හා රෝහල්ගත කිරීම මෙන්ම ඔවුන්ගේ ආශ්‍රිතයන් සොයා ගැනීම සහ වෙන් කර ඇති මධ්‍යස්ථානවල ඔවුන්ව නිරෝධායනය කිරීම, කොවිඩ්-19 රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා වෙන් කළ රෝහල් සංඛ්‍යාව වැඩි කිරීම සහ දැඩි සත්කාර ඒකකවල ධාරිතාව වැඩි කිරීම වැනි වසංගතය මැඩ පැවැත්වීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ඉහළ නැංවීම වැනි ක්‍රියාමාර්ග හරහා වසංගතයට එරෙහිව කටයුතු කිරීමට ශ්‍රී ලංකාව විසින් පූර්වෝපායිකව පියවර ගණනාවක් ගන්නා ලදී. කොවිඩ්-19 වසංගතයේ පළමු රැල්ල අතරතුර, මාර්තු මාසයේ මැද සිට අප්‍රේල් මාසයේ අග දක්වා දිවයින පුරා ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබීම සහ සංචරණ සීමා පැනවීම මගින් වෛරසය ව්‍යාප්තිය සීමා කිරීම සඳහා රජය කඩිනම් හා තීරණාත්මක පියවර ගත්තේය. මැයි මාසයේ මුල් භාගයේ සිට ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීම් ක්‍රමයෙන් ලිහිල් කළ ද, රට තුළ කොවිඩ්-19 වසංගතය නැවත ව්‍යාප්ත වීමේ ඉඩකඩ සීමා කිරීම සඳහා පුද්ගල ඒකරාශීවීම් සම්බන්ධයෙන් වන සීමා පැනවීම, සමාජ දුරස්ථභාවය තබා ගැනීම සඳහා වන පියවර ගැනීම සහ මුව ආවරණ අනිවාර්යයෙන් භාවිත කිරීම සඳහා උපදෙස් ලබාදීම වැනි දෑ අඛණ්ඩව ක්‍රියාත්මක විය. කොවිඩ්-19 වසංගතය වැළැක්වීමේ සහ පාලනය කිරීමේ ක්‍රියාමාර්ග දැඩි ලෙස පිළිපැදීම සහතික කරමින් නව සාමාන්‍ය තත්ත්වයන්ට අනුගත වීම සහ එම වාතාවරණය යටතේ වැඩ කටයුතු සිදු කරන ආකාරය පිළිබඳව සියලු අංශවලට සහ සාමාන්‍ය ජනතාවට මාර්ගෝපදේශ සැපයිණි. ඒ අනුව, වසංගතයේ පළමු රැල්ල 2020 ජූලි මස අවසන් වන විට සාර්ථකව පාලනය කර ගැනීමට හැකි වූ අතර, එතැන් සිට තෙවන කාර්තුව අවසන් වන තුරු දේශීය වශයෙන්

**3.12 රූප සටහන**
**තහවුරු කරන ලද කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව සහ සිදු කරන ලද පී.සී.ආර්. පරීක්ෂණ (දෛනික අගය)**




මූලය: සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය

කොවිඩ්-19 වැළඳුණු රෝගීන් කිසිවෙකු වාර්තා නොවිණි. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතයේ දෙවන රැල්ල ඔක්තෝබර් මස ආරම්භයේ දී ඉස්මතු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන්ම, අතිශය ජනාකීර්ණ බස්නාහිර පළාත තුළ පවතින කාර්මික කලාපවල සහ ප්‍රධාන ආහාර සැපයුම් දාමයන්හි කොවිඩ්-19 නව පොකුරු නිර්මාණය වීමත් සමඟ වසංගතය රට පුරාම ශීඝ්‍රයෙන් පැතිර ගියේය. රට තුළ කොවිඩ්-19 වසංගතය පැතිර ගිය පළමු අවස්ථාවේ හා ගෝලීය වශයෙන් කොවිඩ්-19 වසංගත තත්ත්වය සඳහා වූ ප්‍රතිචාර තුළින් ලද අත්දැකීම්වලින් උගත් පාඩම් ඇසුරින්, රට පුරාම ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබීම වෙනුවට විවිධ ප්‍රදේශවල පවතින කොවිඩ්-19 රෝග අවදානම සලකා බලමින්, ප්‍රාදේශීය වශයෙන් ආර්ථික හා සමාජ කටයුතු සඳහා සීමා පැනවීමට රජය විසින් කටයුතු කරන ලදී. කොවිඩ්-19 දෙවන රැල්ල අවධියේ දී, රෝගීන් සංඛ්‍යාව ශීඝ්‍ර ලෙස ඉහළ ගිය ද, රෝගීන් ගණන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දැනට පවතින සම්පත්වලින් පාලනය කිරීමට හැකි මට්ටමේ පවත්වාගෙන යැමට ශ්‍රී ලංකාව සමත් විය. පළමු රැල්ලට සාපේක්ෂව මරණ සංඛ්‍යාව ඉහළ ගිය ද, ශ්‍රී ලංකාව හා සමානව රෝගීන් වාර්තා වූ අනෙකුත් බොහෝ රටවලට සාපේක්ෂව එය පහළ මට්ටමක පැවතියේය. සෞඛ්‍ය අංශය, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, විශ්වවිද්‍යාල සහ පර්යේෂණ කණ්ඩායම්, බුද්ධි සේවාවල සහ වෙනත් බොහෝ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින්ගේ

ඒකාබද්ධ ක්‍රියාමාර්ග කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය කළමනාකරණය සඳහා සාධනීය ලෙස දායක විය. 2021 මාර්තු මස 31වන විට, වාර්තා වූ මුළු රෝගීන් සංඛ්‍යාව සහ මුළු මරණ සංඛ්‍යාව, පිළිවෙළින්, 92,706ක් සහ 568ක් විය. මෙමගින් සමුච්චිත රෝගීන් සංඛ්‍යාව ජනගහනයෙන් මිලියනයකට 4,229ක් ලෙස සහ මරණ අනුපාතිකය සියයට 0.61ක් ලෙස පිළිබිඹු විය. කොවිඩ්-19 රෝගය ආසාදනය වීම හේතුවෙන් උග්‍ර වූ, බෝ නොවන රෝග ආශ්‍රිත සංකූලතා හේතුවෙන් කොවිඩ්-19 මරණවලින් වැඩි ප්‍රමාණයක් සිදු වී ඇත. වැඩිහිටි ජනගහනය බෝ නොවන රෝගවලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇති බැවින්, කොවිඩ්-19 රෝගය ආශ්‍රිත මරණවලින් සියයට 70ක් පමණ වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයන් වීම සැලකිය යුතු කරුණකි. මේ අතර, සියයට 96.4ක රෝග සුව වීමේ අනුපාතයක් සනිටුහන් කරමින්, 2021 මාර්තු 31 වන විට රෝගීන් 89,407ක් පූර්ණ සුවය ලබා ඇත. තවද, සෞඛ්‍ය අංශය සහ කොවිඩ්-19 රෝග ව්‍යාප්තිය වැළැක්වීමේ කටයුතුවල යෙදී සිටින අනෙකුත් මුල්පෙළ සේවකයින්ට එන්නත් ලබා දීම හරහා ශ්‍රී ලංකාව විසින් 2021 ජනවාරි මාසයේ දී කොවිඩ්-19 මර්දන එන්නත් වැඩසටහන ආරම්භ කරන ලදී. ඒ අනුව, 2021 මාර්තු 31 වන විට, ශ්‍රී ලංකාවේ ලබා දෙන ලද කොවිඩ් මර්දන එන්නත් මාත්‍රා ප්‍රමාණය පුද්ගලයින් 100කට 4.2ක් විය.

**2020 වසරේ දී ශ්‍රී ලංකාවේ තවත් බෝවන රෝග කිහිපයක් ව්‍යාප්ත වීම ද දක්නට ලැබුණි.** සංචරණ සීමා හේතුවෙන් මහජනතාවට ඔවුන්ගේ නිවෙස්වල රැඳී සිටීමට සිදු වූ අතර, එමගින් පිරිසිදු පරිසරයක් පවත්වා ගැනීමට හා ඔවුන්ගේ නිවාස හා අවට පරිසරය මදුරුවන් බෝවීමකින් තොරව තබා ගැනීමට හැකි වීමෙන් 2020 වසර තුළ දී ඩෙංගු වසංගතය යම් තාක් දුරට යටපත් විය. ඒ අනුව, 2019 වසරේ වාර්තා වූ ඩෙංගු රෝගීන් 105,049ක් සහ සියයට 0.15ක් වූ මරණ අනුපාතිකය හා සසඳන විට, 2020 වසර තුළ දී ඩෙංගු රෝගීන් 31,017ක් සහ ඒ ආශ්‍රිත මරණ 36ක් වාර්තා වී ඇත්තේ මරණ අනුපාතිකය සියයට 0.12ක් ලෙස පිළිබිඹු කරමිනි. සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමේ ක්‍රියාමාර්ග මෙන්ම මුව ආවරණ භාවිතය හේතුවෙන්, සුපුරුදු ඍතුමය ඉන්ෆ්ලුවෙන්සා වසංගත තත්ත්වය ද මෙම වසර තුළ දී දක්නට නොලැබුණි. 2020 වසරේ දී රට තුළ මී උණ රෝගීන් 8,545ක් හඳුනාගෙන ඇත. මේ අතර, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නියම කරන ලද ඉලක්කයට වඩා වසර තුනකට පෙර ශ්‍රී ලංකාව රුබෙල්ලා තුරන් කර ඇති රටක් බවට ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සහතික කර තිබේ.

**2020 වසර තුළ දී, රටේ අවධානය බෝනොවන රෝගවල සිට බෝවන රෝග කෙරෙහි යොමු වීමත් සමඟ සෞඛ්‍ය අංශයෙහි ප්‍රමුඛතාවයන් වෙනස් වුව ද, බෝනොවන රෝග මගින් රටට මුහුණ දීමට සිදු වී ඇති ගැටලුව අඩු කිරීම සඳහා රාජ්‍ය සෞඛ්‍ය පද්ධතිය විසින් අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී.** බෝනොවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා සැලසුම් කර තිබූ බොහෝ ක්‍රියාකාරකම්වලට කොවිඩ්-19 වසංගතය මගින් බලපෑම් ඇති වුව ද, රජයේ රෝහල්වලින් දිගු කාලීනව ප්‍රතිකාර ලබා ගන්නා රෝගීන්ට අඛණ්ඩ සේවයක් සැපයීමට උත්සාහ දරමින්, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් බෝනොවන රෝග සම්බන්ධ ආවේක්ෂණ හා අධීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යන ලදී. ඒ අනුව, රජයේ රෝහල් වෙතින් දීර්ඝ කාලීනව ප්‍රතිකාර ලබන බෝනොවන රෝගවලින් පීඩා විඳින රෝගීන්ගේ නිවෙස්වලට ඖෂධ බෙදා හැරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන තිබේ. තැපැල හරහා සෞඛ්‍ය අංශයේ හා සෞඛ්‍ය අංශයේ නොවන රාජ්‍ය නිලධාරීන්, ගම්වල ප්‍රධානීන් හා ස්වේච්ඡා සේවකයන් හරහා ඖෂධ බෙදා හැරීම මගින් මෙම කර්තව්‍යය සිදු කරන ලදී. සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම මෙන්ම බෝනොවන රෝග හා සම්බන්ධ හදිසි රෝගාබාධ තත්ත්වවල පූර්ව ලක්ෂණ හඳුනා ගැනීම සහ එවැනි අවස්ථාවක දී වෛද්‍ය සේවා ලබා ගන්නා ආකාරය පිළිබඳව මහජනතාවට අවබෝධයක් ලබා දීම සඳහා ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය හරහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. ප්‍රජාව තුළ සිටින

**3.9 සංඛ්‍යා සටහන**

**සෞඛ්‍ය සේවයේ මූලික ලක්ෂණ**

| ශීර්ෂය | 2019 (අ) | 2020 (ආ) |
|---|---|---|
| 1. රාජ්‍ය අංශය | | |
| රෝහල් සංඛ්‍යාව (බටහිර වෛද්‍ය සේවය) | 603 | 609 |
| ඇඳන් සංඛ්‍යාව | 77,964 | 77,121 |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක | 499 | 518 |
| වෛද්‍යවරුන් සංඛ්‍යාව | 18,130 | 19,615 |
| සහකාර වෛද්‍යවරුන් සංඛ්‍යාව | 756 | 658 |
| හෙද සේවක සංඛ්‍යාව | 38,276 | 37,634 |
| උපස්ථායක සංඛ්‍යාව | 8,531 | 8,384 |
| 2. ආයුර්වේද | | |
| රෝහල් සංඛ්‍යාව | 116 | 118 |
| ඇඳන් සංඛ්‍යාව | 5,052 | 5,058 |
| සුදුසුකම්ලත් ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව | 1,768 | 1,757 |
| ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව (ඇ) | 25,783 | 26,061 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති ආයුර්වේද වෛද්‍යවරුන්

මූලයන්: සෞඛ්‍ය අමාත්‍යාංශය
ආයුර්වේද දෙපාර්තමේන්තුව

3

බෝනොවන රෝග ආශ්‍රිත ප්‍රතිකාර ලබා දෙන මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් හට, බෝනොවන රෝගවලින් පෙළෙන රෝගීන්ට සහනය ලබා දීම සඳහා කරන ප්‍රතිකාර නිවස තුළ දී ම ලබා දීම පිළිබඳ මාර්ගෝපදේශ ලබා දෙන ලදී. තවද, ප්‍රතිශක්තිකරණය අඩු, අධි අවදානම් රෝගීන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා පහසුකම් සැලසීමට රජයේ රෝහල්වල වෘක්කවේදී සායන 16ක දුරකථන මාර්ග හරහා වෛද්‍ය උපදෙස් සැපයෙන (telemedicine) පද්ධති ස්ථාපිත කරන ලදී.

**සෞඛ්‍ය ක්ෂේත්‍රයේ භෞතික හා මානව සම්පත් වැඩි දියුණු කිරීම සඳහා රජය විසින් අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී.** හම්බන්තොට සහ නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල්වලට අදාළ ඉදිකිරීම් කටයුතු සහ පොළොන්නරුවේ ජාතික වෘක්කවේදී රෝහල ඉදිකිරීම මෙම වසර තුළ දී අවසන් කරන ලදී. මාතර දිස්ත්‍රික්කයේ මාතෘ හා අලුත උපන් දරුවන්ගේ සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය, උතුරු පළාත් රෝහල් සංවර්ධන ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා ජාතික රෝහලේ පරික්‍රමණ ප්‍රතිකාර මධ්‍යස්ථානය (Ambulatory Care Centre) සංවර්ධනය කිරීම, ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය මෙන්ම කරාපිටියේ මාතෘ රෝහලක් සහ රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද රෝග මධ්‍යස්ථානයක් ඉදි කිරීම වැනි භෞතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 2020 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය. කොවිඩ්-19 වසංගතයේ පළමු රැල්ල සහ දෙවැනි රැල්ල කාලපරිච්ඡේද තුළ, වසංගතය මැඩලීම සඳහා වෛද්‍ය උපකරණ බෙදා හැරීම වෙනුවෙන් රජය විසින් දළ වශයෙන් රුපියල් බිලියන 4.5ක් වියදම් කරන ලදී. සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ දත්තවලට අනුව, 2020 වසර අවසානය වන විට රජයේ රෝහල්වල සෑම පුද්ගලයින් 1,117 දෙනෙකු සඳහා එක් වෛද්‍යවරයෙක් සහ සෑම පුද්ගලයින් 582 දෙනෙකු සඳහා එක් හෙද නිලධාරියෙක් බැගින් සේවය කළ අතර, සෑම පුද්ගලයින් 1,000කට ඇඳන් 3.5ක් තිබිණි. මේ අතර, 2020 වසර අවසානය වන විට, රජයේ රෝහල්වල දැඩි සත්කාර ඇඳන් 715ක් පැවති අතර, ඒ අනුව සෑම පුද්ගලයින් 100,000කට පැවති දැඩි සත්කාර ඒකක ඇඳන් සංඛ්‍යාව 3.3ක් බැගින් වාර්තා විය. කොවිඩ්-19 වසංගතයට එරෙහිව පමණක් නොව ඩෙංගු වැනි අනෙකුත් බෝවන රෝග වලට එරෙහිව කටයුතු කිරීමේ දී ත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ භෞතික සම්පත්, විශේෂයෙන්ම, දැඩි සත්කාර පහසුකම් වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ.

**වසංගතය මගින් ඇති වූ අභියෝගතා මධ්‍යයේ වුව ද, පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා 2020 වසරේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.** 2020 වසර අවසන් වන විට, සමස්ත ඇඳන් 5,173කින් සමන්විත පෞද්ගලික රෝහල් 217ක් ක්‍රියාත්මක විය. කොවිඩ්-19 රෝගීන්ගේ සහ කොවිඩ්-19 ආසාදනය වී ඇතැයි සැක සහිත රෝගීන්ගේ සායනික කළමනාකරණ කටයුතු මෙන්ම, පී.සී.ආර්. පරීක්ෂණ පැවැත්වීම පිළිබඳව පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නන්ට සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. සංචරණ සීමා මධ්‍යයේ, ප්‍රමුඛ පෙළේ සෞඛ්‍ය සේවා සපයන්නන් විසින් රෝගීන්ගේ වෛද්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා රෝගීන් පිළිබඳ මූලික පරීක්ෂා කිරීමේ මංගත පහසුකම් සහ දුරකථන මාර්ග පද්ධති හරහා උපදේශන සේවා ලබා දීම (telemedicine) වැනි නව්‍ය ප්‍රවේශයන්ට යොමු වූහ. සාමාන්‍යයෙන් පුද්ගලික අංශයෙන් ඖෂධ මිලදී ගන්නා පුද්ගලයින් හට නිවෙස් වෙත ඖෂධ ගෙන ගොස් දීම සඳහා, ඔසුසැල් හිමිකරුවන්ගේ සංගමයේ සහයෝගය ද ඇතිව, රාජ්‍ය හා පෞද්ගලික ඔසුසැල් සමඟ එක්ව අන්තර්ජාලය පදනම් කරගත් යාන්ත්‍රණයක් ස්ථාපිත කරන ලදී. දිවයින පුරා පිහිටි ඔසුසැල් 1,800කට අධික සංඛ්‍යාවක් මේ හා සම්බන්ධ වී ඇති අතර, මෙම සේවාව මගින් රටේ සමස්ත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසවලින් සියයට 96.3ක් ආවරණය කෙරිණි.

## අධ්‍යාපනය

**2020 වසරේ මුල් කාලයේ දී අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය පිහිටුවීමත් සමඟ, අධ්‍යාපන අමාත්‍යාංශය අදාළ පාර්ශ්වකරුවන් සමඟ එක්ව වත්මන් අධ්‍යාපන ක්‍රමය පිළිබඳව ගැඹුරු සමාලෝචනයක් ආරම්භ කළේය.** යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අතරට විෂයමාලා හා ඉගෙනුම් උපාය මාර්ග සංශෝධනය කිරීම, ඉගැන්වීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම හා ප්‍රමිතිකරණය කිරීම, අධ්‍යාපනය, රැකියාව සහ ඵලදායී ආකල්ප අතර පවතින සම්බන්ධතාව මෙන්ම, සමාජයේ ජීවත්වන්නන් ලෙස සමාජමය වශයෙන් ලබා දිය යුතු දායකත්වය හඳුනා ගැනීම ඇතුළත් වේ. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලැබුව ද, යෝජනා සමාලෝචනය කිරීම හා ඉන් අනතුරුව ක්‍රියාත්මක කිරීම, අදාළ රාජ්‍ය අමාත්‍යාංශ ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් සිදු කිරීමට නියමිතය. තෝරාගත් පළාත් පාසල් කිහිපයක් වැඩිදියුණු කිරීම තුළින්, ජාතික පාසල් සංඛ්‍යාව 1,000ක් දක්වා ඉහළ නැංවීමේ අරමුණ ඇතිව පළමු අදියර

යටතේ පාසල් 123ක් ද, දෙවන අදියර යටතේ තවත් පාසල් 671ක් ද දියුණු කිරීමට දැනටමත් හඳුනාගෙන තිබේ. තවද, එක් දිස්ත්‍රික්කයකට එක් ත්‍රිභාෂා පාසලක් බැගින් අලුතින් ආරම්භ කිරීමට නියමිතය. වසර 13ක අනිවාර්ය අධ්‍යාපන වැඩසටහන පාසල් 421ක් ආවරණය වන පරිදි පුළුල් කරන ලද අතර, සිසුන්ගේ පැමිණීම මත පදනම්ව, ආයතනවලට අනුයුක්ත කරන ලද සිසුන්ට දිනකට රු.500ක දීමනාවක් ලබා දෙන ලදී. මෙම වැඩසටහන යටතේ, සිසුන් 1,142ක් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4වන මට්ටමේ පුහුණුව සම්පූර්ණ කර ඇති අතර, තවත් සිසුන් 5,650ක් ජාතික වෘත්තීය සුදුසුකම් පුහුණුව ආරම්භ කිරීමට නියමිතය. මෙම වැඩසටහනේ සාර්ථකත්වය සහතික කරලීම සඳහා, වසර පුරා භෞතික හා ඉගැන්වීම් ආධාරක යටිතල පහසුකම් වැඩිදියුණු කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශයෙහි අනෙකුත් ප්‍රධාන වැඩසටහන් අතරට, පාසල්වල යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි හා අනෙකුත් විදේශීය භාෂා, තාක්ෂණික අධ්‍යාපනය, ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය වැනි විෂයයන් සඳහා සිසුන්ගේ යොමුවීම ඉහළ නැංවීම යන වැඩසටහන් ඇතුළත් වේ. ගුරු සංවර්ධනය, අධ්‍යාපනය සහ කළමනාකරණය සඳහා ද පියවර ගන්නා ලදී. පෙර පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2020 වසරේ මුල් භාගයේ දී අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගන්නා ලදී. පෙර පාසල්, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් නියාමනය, අධීක්ෂණය සහ ජාතික මට්ටමින් මග පෙන්වීම සඳහා අදාළ ක්ෂේත්‍රයේ විද්වතුන්ගෙන් සහ රජයේ අනෙකුත් පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ ජාතික කළමනාකරණ හා නියාමන කමිටුව පිහිටුවීම සඳහා 2021 මාර්තු මාසයේ දී අනුමැතිය ලබා ගන්නා ලදී.

**2020 මාර්තු මාසයේ සිට බස්නාහිර පළාත පුරා දීර්ඝතම කාලයක් පුරාවට ද, වරින් වර රට පුරා ද පාසල් වසා දැමීම මධ්‍යයේ වුව ද, අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා නව වැඩසටහන් කිහිපයක් ආරම්භ කරන ලදී.** අධ්‍යාපන ක්‍රියාකාරකම් යම් මට්ටමකට පවත්වා ගැනීමේ ප්‍රයත්නයක් ලෙස, මංගත ඉගැන්වීම් සහ ඉගෙන ගැනීම් සඳහා පහසුකම් සැපයීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන් සමඟ හවුල් විය. නිවසේ සිට අඛණ්ඩව අධ්‍යයන කටයුතු සිදු කිරීමට පහසුකම් සැලසීම සඳහා සියලු ශ්‍රේණිවලට අදාළව ඉගෙනීම සඳහා අවශ්‍ය විවිධ දෑ බෙදා හැරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙහි නිල අධ්‍යාපන වෙබ් අඩවිය වන ඊ-තක්සලාව වේගයෙන් සංවර්ධනය කරන ලදී. 'ගුරු ගෙදර' නමින් අධ්‍යාපනික වැඩසටහන් කිහිපයක් ඒ සඳහා වෙන් කළ රූපවාහිනී නාලිකා ඔස්සේ සිංහල හා දෙමළ භාෂාවෙන් විකාශය කිරීම සඳහා අධ්‍යාපන

**3.10 සංඛ්‍යා සටහන**

**සාමාන්‍ය අධ්‍යාපනයේ මූලික ලක්ෂණ**

| ශීර්ෂය | 2019(අ) | 2020(ආ) |
|---|---|---|
| 1. මුළු පාසල් සංඛ්‍යාව | 11,084 | 11,077 |
| රජයේ පාසල් | 10,165 | 10,155 |
| ප්‍රාථමික පාසල් | 3,891 | 3,891 |
| ද්විතීයික පාසල් | 6,274 | 6,264 |
| ඉන්, ජාතික පාසල් | 373 | 373 |
| වෙනත් පාසල් | 919 | 922 |
| පිරිවෙන් | 801 | 802 |
| පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ) | 118 | 120 |
| 2. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ඈ) | 4,268,039 | 4,240,433 |
| රජයේ පාසල් | 4,061,653 | 4,031,865 |
| වෙනත් පාසල් | 206,386 | 208,568 |
| පිරිවෙන් | 68,319 | 69,709 |
| පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ) | 138,067 | 138,859 |
| ජාත්‍යන්තර පාසල් | 140,223 | ලැ.නො. |
| 3. මුළු ගුරුවරු සංඛ්‍යාව (ඈ) | 261,803 | 264,781 |
| රජයේ පාසල් | 246,592 | 249,387 |
| වෙනත් පාසල් | 15,211 | 15,394 |
| පිරිවෙන් | 7,200 | 7,221 |
| පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ) | 8,011 | 8,173 |
| ජාත්‍යන්තර පාසල් | 13,568 | ලැ.නො. |
| 4. නව ඇතුළත්කර ගැනීම් (ඉ) | 328,632 | 318,179 |
| 5. ශිෂ්‍ය / ගුරු අනුපාතය | | |
| රජයේ පාසල් | 16 | 16 |
| වෙනත් පාසල් | 14 | 14 |
| ජාත්‍යන්තර පාසල් | 10 | ලැ.නො. |
| 6. ප්‍රාථමික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (1-5 ශ්‍රේණි) | 91.12 | ලැ.නො. |
| 7. ද්විතීයික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (6-11 ශ්‍රේණි) | 96.62 | ලැ.නො. |
| 8. වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (1-9 ශ්‍රේණි) | 94.77 | ලැ.නො. |
| 9. ගුරු පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව | 8 | 8 |
| 10. වසර තුළ දී පුහුණු කළ ගුරුවරු සංඛ්‍යාව | 2,954 | 973 |
| 11. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව | 19 | 19 |
| පුහුණුව ලත් මුළු ගුරුවරු සංඛ්‍යාව | 16,237 | 12,373 |
| වසර තුළ දී පුහුණුව නිමකළ ගුරු සංඛ්‍යාව | 4,247 | 3,864 |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) රජය විසින් අනුමත පෞද්ගලික පාසල් සහ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා වූ පාසල් (මෙයට සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ ජාත්‍යන්තර පාසල් අයත් නොවේ).

(ඈ) ජාත්‍යන්තර පාසල් වල දත්ත ඇතුළත් නොවේ.

(ඉ) රජයේ පාසල් සඳහා පමණි.

මූලය: අධ්‍යාපන අමාත්‍යාංශය

3

අමාත්‍යාංශය අදාළ පාර්ශ්වයන් සමග අඛණ්ඩව සහයෝගයෙන් කටයුතු කළ අතර, සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සිසු සිසුවියන් සඳහා ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව නව රූපවාහිනී නාලිකාවක් ද දියත් කළේය. පාසල් නැවත විවෘත කිරීමට පෙර, විෂබීජහරණය, අත් සේදීම සඳහා ජල සැපයුම, පන්ති කාමර සැකසීම සහ ආරක්ෂිත ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන කොවිඩ්-19 වැළැක්වීමේ වෙනත් ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් උපදෙස් ලබා දෙන ලදී. නිරෝධායන මධ්‍යස්ථානවල සිටින සහ රෝහල්වල ප්‍රතිකාර ලබන ශිෂ්‍යයන් සඳහා විශේෂ විභාග මධ්‍යස්ථාන පිහිටුවමින් සහ ප්‍රවාහන පහසුකම් ලබා දෙමින්, කොවිඩ්-19 අවහිරතා මධ්‍යයේ වුව ද, 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සහ අ.පො.ස. උසස් පෙළ හා සාමාන්‍ය පෙළ විභාග,

### 3.11 සංඛ්‍යා සටහන
### විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ මූලික ලක්ෂණ (අ)

| ශීර්ෂය | 2019 (ආ) | 2020(ඇ) |
|---|---|---|
| 1. විශ්වවිද්‍යාල සංඛ්‍යාව | 15 | 15 |
| 2. අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව | 20 | 20 |
| 3. ශිෂ්‍ය සංඛ්‍යාව (උපාධි අපේක්ෂක) (ඈ) | | |
| විශ්වවිද්‍යාල (ඉ) | 100,944 | 106,304 |
| ආයතන | 3,724 | 3,844 |
| විවෘත විශ්වවිද්‍යාලය | 25,165 | 26,255 |
| 4. මුළු කාර්යමණ්ඩලය (සියලුම විශ්වවිද්‍යාලවල) | | |
| අධ්‍යයන | 6,321 | 6,386 |
| අනධ්‍යයන | 13,029 | 12,962 |
| 5. ශිෂ්‍ය / ගුරු අනුපාතය | 17.5 | 18.9 |
| 6. වයස් විශේෂිත උපාධි අපේක්ෂක ඇතුළත්වීමේ අනුපාතය (අවුරුදු 19-23) (ඈ) | 7.8 | 8.2 |
| 7. අ.පො.ස. උසස් පෙළ සිට විශ්වවිද්‍යාලයට ඇතුළත්වීම | | |
| ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ ප්‍රමාණය (%) | 62.87 | 62.40 |
| සුදුසුකම් ලැබූවන්ගෙන් ඇතුළත් වූ ප්‍රමාණය (%) | 18.98 | 22.50 (ඊ) |
| 8. උපාධිලත් සංඛ්‍යාව (උ) | 34,881 | ලැ.නො. |
| ප්‍රථම උපාධි | 24,890 | ලැ.නො. |
| පශ්චාත් උපාධි | 9,991 | ලැ.නො. |
| 9. ප්‍රථම උපාධිය සඳහා නව ඇතුළත්වීම (ඌ) | 31,902 | ලැ.නො. |
| 10. විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීම සඳහා සුදුසකම් ලැබූ සංඛ්‍යාව | 167,992 | 181,144 |

මූලය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) බාහිර උපාධි පාඨමාලා ඇතුළත් නොවේ.
(ඉ) විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් නොවේ.
(ඊ) ඇස්තමේන්තු
(උ) බාහිර උපාධි හා විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් වේ.
(ඌ) බාහිර උපාධි හා විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් නොවේ.

විභාග දෙපාර්තමේන්තුව විසින් සාර්ථකව පවත්වන ලදී. වසරේ දෙවන හා සිව්වන කාර්තුවල දී කොවිඩ්-19 වසංගතයේ පළමු රැල්ල සහ දෙවන රැල්ල හමුවේ, දීර්ඝතම පාසල් වසා දැමීමට බස්නාහිර පළාත මුහුණ දුන්නේය. ජාතික මට්ටමේ විභාගවලට සහභාගී වීමට පෙර 5, 11 සහ 13 යන ශ්‍රේණිවල සිසුන් සඳහා, කෙටි කාලයකට අධ්‍යාපන කටයුතු නැවත ආරම්භ කෙරිණි. කොවිඩ්-19 දෙවන රැල්ලෙන් අනතුරුව, 2021 මාර්තු මාසයේ අග සිට අදියර කිහිපයකින් පාසල් නැවත විවෘත කිරීමත්, සිසුන්ගේ පැමිණීම පන්තියේ ප්‍රමාණය අනුව තීරණය කිරීමත් සමග සියලු ශ්‍රේණි සඳහා අධ්‍යාපන කටයුතු නැවත ආරම්භ කරන ලදී. කොවිඩ්-19 වසංගතය තුළින් පැන නැඟුණු අභියෝගවලට මුහුණ දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගනු ලැබූ විවිධාකාර විසඳුම් පැසසුමට ලක් විය යුතු අතර, අනාගතයේ දී මංගත අධ්‍යාපන කටයුතු සිදු කිරීමට සහ පාසල තුළ ඉගෙනීම වෙනුවට වෙනත් විකල්ප භාවිත කිරීම කෙරෙහි සැලසුම් නිර්මාණය කිරීම සඳහා කොවිඩ්-19 වසංගතය තුළින් ලැබුණු අත්දැකීම් යොදා ගත යුතු බව අවධාරණය කළ යුතුය. ගුරුවරුන්, සිසුන් සහ අදාළ නිලධාරීන් නව ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රමවේද සඳහා සාපේක්ෂව හැකි ඉක්මනින් අනුගත වුව ද, පාසල් මට්ටමින් මෙන්ම, ශිෂ්‍යයන්ගේ මට්ටමින් ද තාක්ෂණය හා සම්බන්ධ යටිතල පහසුකම් වෙත ප්‍රවේශ වීමේ දී සැලකිය යුතු විෂමතා පවතින බව සහ ඉගැන්වීම සඳහා විද්‍යුත් උපකරණ භාවිත කිරීමට ගුරුවරුන්ට ඇති හැකියාව සීමිත වන බව පසුගිය වසර තුළ අත්දුටු මංගත ඉගැන්වීම් සහ ඉගෙනුම් අත්දැකීම් මගින් පෙන්නුම් කරයි. මිශ්‍ර ඉගෙනුම් ක්‍රම අඛණ්ඩව සිදු කරගෙන යාම සඳහා බහු ආංශික සම්බන්ධීකරණයක් ඔස්සේ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමේ වැඩසටහනක අවශ්‍යතාවය පවතී. විශේෂයෙන්ම, විවිධ ආදායම් මට්ටම් සහ විවිධ ඉගෙනුම් අපහසුතා ඇති වරප්‍රසාද නොලත් ශිෂ්‍ය කණ්ඩායම් තුළ ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ඇති කිරීම සඳහා මෙය ඉතා වැදගත් වේ.

**වසංගතය හේතුවෙන් ඇති වූ අවහිරතා මධ්‍යයේ අධ්‍යාපන කටයුතු දුරස්ථ ඉගෙනුම් ක්‍රම හරහා ඉදිරියට සිදු කරගෙන යාමට උසස් අධ්‍යාපන පද්ධතිය කටයුතු කළේය.** ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබූ කාලපරිච්ඡේදය තුළ දී, රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් පෙර සිට භාවිත කෙරුණු, මිශ්‍ර ඉගෙනුම් ක්‍රමයේ අංගයක් වූ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) හරහා විශ්වවිද්‍යාල විසින් මංගත ඉගෙනුම් ක්‍රියාවලිය වේගවත්ව ආරම්භ කරන ලදී. 2020 මාර්තු මාසයේ අවසානයේ සිට 2021 ජනවාරි මාසයේ අවසානය දක්වා

කාලය තුළ, මිලියන 22.3ක අන්තර්ජාල සහභාගීත්වයක් සහිතව සූම් (Zoom) තාක්ෂණ සැසි 502,000ක් පවත්වා ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් යන දෙ අංශයම අධ්‍යාපන කටයුතු සඳහා එලෙස ශීඝ්‍රයෙන් තාක්ෂණය භාවිත කිරීම හා ඒ සඳහා ඔවුන් උද්යෝගීමත් ලෙස සහභාගී වීම බෙහෙවින් ප්‍රශංසනීය වේ. කෙසේ වෙතත්, පාසල් අධ්‍යාපනයේ දී මෙන්ම, උසස් අධ්‍යාපනය ලබා දීමේ ක්‍රමයේ ඇති වූ වෙනස වරප්‍රසාද නොලත් ශිෂ්‍ය කණ්ඩායම්වලට විෂමානුපාතික ලෙස බලපාන්නට ඇත. මෙම කාල සීමාව තුළ දී, සංවෘත ග්‍රන්ථ පරීක්ෂණ (closed book written examinations) පැවැත්වීමට ඇති නොහැකියාව හේතුවෙන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විකල්ප ඇගයීම් ක්‍රම සඳහා මාර්ගෝපදේශ නියම කරන ලදී. මේ අතර, ගම්පහ දිස්ත්‍රික්කයේ සංවර්ධන ඉලක්ක සමඟ ගැලපෙන පරිදි, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට නගා සිටුවීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේය. හෙද හා ගුරු පුහුණු පාසල් වෙනුවට, නිශ්චිත අරමුණු සඳහා විශ්වවිද්‍යාල ලෙස සරසවි දෙකක් ස්ථාපිත කිරීමට හැකිවන පරිදි, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. දැරිය හැකි මුදලකට සහ භූගෝලීය අවහිරතාවලින් තොර ගුණාත්මක බවින් ඉහළ උසස් අධ්‍යාපන වැඩසටහන් සඳහා ප්‍රවේශය වැඩි කිරීමේ අරමුණින් යුතුව රජය විසින් රාජ්‍ය අංශයේ ලාභ නොලබන ආයතනයක් ලෙස, නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මත පදනම් වූ 'අතථ්‍ය සරසවියක්' (virtual university) පිහිටුවීමට නියමිතය. රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූලව, දිස්ත්‍රික්ක 10ක, එම දිස්ත්‍රික්කවල සුවිශේෂී සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා, 'පුරවර විශ්වවිද්‍යාල' පිහිටුවීමට යෝජනා සකස් කෙරෙමින් පවතී. රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු පුළුල් කිරීම පිණිස නව පීඨ, දෙපාර්තමේන්තු, උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන් ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබා දීමට ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කටයුතු කළේය. තවදුරටත් පවතින නවක වදය පාලනය කිරීමේ අදහසින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා සන්නිවේදන යෙදවුම් හඳුන්වාදෙනු ලැබූ අතර, ඒ පිළිබඳව නවකයින් දැනුම්වත් කිරීමේ හා ඔවුන් හැඩ ගැස්වීමේ වැඩසටහන් ද පවත්වනු ලැබීය.

**පෞද්ගලික අංශය රජය සමඟ එකතු වී තෘතීයික අධ්‍යාපනය ලබා දීමේ කටයුතුවල අඛණ්ඩව නිරත විය.** 2020 වසර අවසානය වන විට, ප්‍රතීතනය ලත් උපාධි වැඩසටහන් 164ක් පිරිනමන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 21ක් උපාධි ප්‍රදානය කරන ආයතන ලෙස පිළිගෙන තිබේ. වසර තුළ දී, උපාධි ප්‍රදානය කරන ආයතන ලෙස රාජ්‍ය නොවන නව උසස් අධ්‍යාපන ආයතන තුනක් පිළි ගන්නා ලද අතර, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමන නව උපාධි වැඩසටහන් 18ක් පිළිගැනීමට ලක්විය. මේ අතර, නව වැඩසටහන් කිහිපයක සමාලෝචන ක්‍රියාත්මක වෙමින් පැවතුණි. තත්ත්ව සහතික කිරීම හා ප්‍රතීතන කොමිෂන් සභාව පිහිටුවීම සඳහා නෛතික රාමුවක් සැකසීමේ අරමුණින් කෙටුම්පත් කරන ලද පනතක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලදී. එම ගැසට් පත්‍රය සඳහා මේ වන විට අදාළ පාර්ශ්වකරුවන්ගෙන් අදහස් විමසෙමින් පවතී. උපාධිධාරීන්ගේ සේවා නියුක්තභාවය පිළිබඳ ගැටලුව සැලකිල්ලට ගනිමින්, විද්‍යාව, තාක්ෂණවේද, ඉංජිනේරු සහ ගණිත (STEM) යන විෂයයන් කලා විෂය ධාරාව හරහා ඉගැන්වීම පිළිබඳ සලකා බැලීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

### 3.12 සංඛ්‍යා සටහන
### තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ මූලික ලක්ෂණ

| ශීර්ෂය | 2019 | 2020 (අ) |
|---|---|---|
| 1. ලියාපදිංචි කළ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන සංඛ්‍යාව (ආ) | 1,290 | 1,239 |
| රාජ්‍ය | 582 | 570 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 708 | 669 |
| 2. පිළිගත් පාඨමාලා සංඛ්‍යාව | 2,691 | 3,413 |
| රාජ්‍ය | 2,099 | 2,900 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 592 | 513 |
| 3. ප්‍රදානය කළ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් සංඛ්‍යාව | 78,007 | 47,621 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 11,199 | 8,670 |
| ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 11,387 | 8,266 |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 25,696 | 15,608 |
| ජාතික තරුණ සේවා සභාව | 1,933 | 2,118 |
| පෞද්ගලික ආයතන | 27,792 | 12,959 |

(අ) තාවකාලික
(ආ) වසර අවසානයේ දී

මූලය: තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

**නිපුණතා සම්බන්ධයෙන් ආර්ථිකයේ දැනට පවතින අවශ්‍යතා පිළිබඳව නිසි අවධානයක් යොමු කරමින්, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය විසින් ශ්‍රම බලකායේ නිපුණතා පදනම වැඩි දියුණු කිරීම සඳහා සිය ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරන ලදී.**

3

2020 වසර අවසන් වන විට, පාඨමාලා 3,400කට අධික සංඛ්‍යාවක් පවත්වාගෙන යන කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ ප්‍රතීතනය කළ ආයතන 1,239ක් පැවතුණි. වෘත්තීය සුදුසුකම් වැඩසටහන්වල උචිතභාවය දියුණු කිරීමේ ප්‍රයත්නයක් ලෙස, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන් හතළිහකට අධික සංඛ්‍යාවක් සඳහා නව ජාතික නිපුණතා ප්‍රමිති සකස් කළ අතර, ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන් විසිපහකට අධික සංඛ්‍යාවක් සඳහා එම ප්‍රමිති සංශෝධනය කළේය. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය තුළ හඳුන්වා දුන් මංගත ක්‍රමවේදවලට ප්‍රතිචාර දක්වමින්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මංගත ක්‍රමවේද හරහා පාඨමාලා පවත්වන පුහුණු ආයතන ලියාපදිංචි කිරීම සඳහා ඇගයීම් නිර්ණායක සහ සිසුන්ගේ පුහුණු කාර්ය සාධනය පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා මංගත පද්ධතියක් සකස් කරන ලදී. අධ්‍යාපනික හා පුහුණු කටයුතුවල අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා, මෙම කාල සීමාව තුළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මංගත සම්මන්ත්‍රණ (Webinar) කිහිපයක් පවත්වන ලද අතර, විවිධ විෂය ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව වෘත්තීය පුහුණුවන්නන් සඳහා පාඩම් මාලාවක් විකාශය කිරීම සඳහා රූපවාහිනී නාලිකා සමඟ සහයෝගයෙන් කටයුතු කළේය. වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව කාර්මික අංශයේ නියෝජිතවරුන් සමඟ සමීපව කටයුතු කළ අතර, ඔවුන් පිළිබඳ දත්ත ගබඩාවක් ද සකස් කළේය. සුදුසුකම්ලත් ශ්‍රම බලකායට විදේශයන් හි සේවා නියුක්ත වීමට ඇති අවස්ථාව වැඩි දියුණු කිරීම සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ඊට සමාන වෙනත් විදේශීය සුදුසුකම් රාමුවලට ගැළපෙන අයුරින් සකස් කිරීමට මේ වන විට මූලික පියවර ගෙන තිබේ.

## නිවාස හා නාගරික සංවර්ධනය

**රජය විසින් සිදු කරනු ලැබූ නිවාස හා නාගරික සංවර්ධන කටයුතු, කොවිඩ්-19 වසංගතයේ අහිතකර ප්‍රතිවිපාක හමුවේ 2020 වසරේ දී පසුබෑමට ලක් විය.** රාජ්‍ය සේවකයන් සහ වෘත්තිකයන් සඳහා සාධාරණ මිල ගණන් යටතේ නිවාස පහසුකම් සැපයීමේ අපේක්ෂාවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2020 වසරේ දී මැදි ආදායම් නිවාස සංවර්ධන ව්‍යාපෘතිය අඛණ්ඩව සිදු කරගෙන යන ලදී. ඒ අනුව, 'ඕවල් විව්' සහ 'ලේක් ක්‍රෙස්ට්' යන රාජ්‍ය සේවකයන් සඳහා වූ නිවාස ව්‍යාපෘති 2020 වසරේ දී සම්පූර්ණ කරන ලදී. තවද, නාගරික සංවර්ධන අධිකාරිය විසින් බොරැල්ල ප්‍රදේශයේ නිවාස ඒකක 400කින් යුතු ඉහළ මැදි ආදායම් නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර, තවත් නිවාස ව්‍යාපෘති දෙකක් තලවතුගොඩ ප්‍රදේශයේ ආරම්භ කිරීමට නියමිතය. මේ අතර, කොළඹ සහ අනෙකුත් ප්‍රධාන නගරවල මැදි ආදායම් ජන කොට්ඨාසය ඉලක්ක කරමින්, ඔවුනට දැරිය හැකි මිලකට ලබාගත හැකි නිවාස ඒකක 5,000කින් සමන්විත වෙනත් නිවාස ව්‍යාපෘතියක් 2021 වසරේ දී ආරම්භ කිරීමට නියමිතය. තවද, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතාව සපුරාලීමේ අරමුණෙන් 'ඔබට ගෙයක්-රටට හෙටක්' නම් නව නිවාස වැඩසටහනක් දියත් කළේය. ව්‍යාපෘතියෙහි ආරම්භයේ පැවති ඉලක්කය වූ වාර්ෂිකව නිවාස ඒකක 14,022ක් ඉදි කිරීම, සීමිත අයවැය ප්‍රතිපාදන සහ වසංගතය හේතුවෙන් ඉදිකිරීම් අංශයට ඇති වූ බාධා මුල් කොටගෙන 2020 වසරේ දී නිවාස ඒකක 10,000ක් බවට සංශෝධනය කරන ලදී. මෙම වැඩසටහන යටතේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සැලසුම වන්නේ අවම වශයෙන් එක් ග්‍රාම නිලධාරී වසමක එක් අඩු ආදායම්ලාභී පවුලකට නිවසක් තනා ගැනීම සඳහා රුපියල් 600,000ක ප්‍රදානයක් ලබා දීමය. මෙම වැඩසටහන යටතේ, 2020 වසරේ දී නිවාස ඒකක 9,972ක් ඉදිකිරීම ඇරඹුණු අතර, ඉන් නිවාස ඒකක 3,949ක ඉදිකිරීම් කටයුතු, සහභාගිත්ව පදනම මත වසර තුළ දී සම්පූර්ණ කරන ලදී.

**කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු 2020 වසරේ අඛණ්ඩව සිදු කරගෙන යන ලදී.** අප ජල පද්ධති, වාරිමාර්ග ජලාශ, පානීය ජලාශ හා පොම්පාගාර ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය හා සම්බන්ධ වැඩකටයුතුවලින් සියයට 90කට වැඩි ප්‍රමාණයක් 2020 වසර අවසන් වන විට සම්පූර්ණ කර ඇති අතර, බාහිර උපයෝගිතා සැපයුම් සේවාවන්හි ඉදිකිරීම් කටයුතු වසර තුළ දී ක්‍රියාවට නැංවිණි. රජය විසින් පනවන ලද සංචරණ සීමා හේතුවෙන් මාර්තු සහ අප්‍රේල් මාස තුළ වරාය නගර ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් කටයුතු නතර කෙරුණ ද, මේ වන විට එම කටයුතු කඩිනමින් සිදු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය දකුණු ආසියානු කලාපයේ විශේෂ ආර්ථික කලාපයක් ලෙස ඉදිරියට එනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, එ.ජ. ඩොලර් බිලියන 1.1ක වියදමින් යුතු මූල්‍ය හා වාණිජ මධ්‍යස්ථානය ඉදිකිරීමේ මූලික කටයුතු දැනටමත් ආරම්භ කර තිබේ. විශේෂ ආර්ථික

කලාපය පිහිටුවීම සහ එම කලාපය පාලනය කිරීම සඳහා වන නියාමන රාමුව ඉදිරිපත් කරමින් කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත 2021 මාර්තු මස අග දී ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

**නාගරික ප්‍රදේශවල කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වූ රජයේ ප්‍රයත්නය 2020 වසරේ දී ඉදිරියට ක්‍රියාත්මක විය.** වසර අවසානය වන විට සියයට 80ක මූල්‍ය සහ භෞතික ප්‍රගතියක් අත් කර ගනිමින් කොළඹ අගනගරාශ්‍රිත කලාපයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු වසර තුළ දී අඛණ්ඩව සිදු කරගෙන යන ලදී. 2020 වසර අවසානය වන විට මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද, කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් ඉදි කිරීම් කටයුතු ප්‍රමාද විය. ඉහත සඳහන් කළ ව්‍යාපෘතිය යටතේ, ආරුවක්කාලු සනීපාරක්ෂක කසල අංගනයේ ඉදි කිරීම් කටයුතු සියයට 98ක ප්‍රගතියක් අත් කරගෙන ඇති අතර, ආරුවක්කාලු කාන්දුකරණ පවිත්‍රාගාරයෙහි සාමාන්‍ය මෙහෙයුම් ආරම්භයට පෙර, සිදු කරන පූර්ව මෙහෙයුම් කටයුතු 2020 වසරේ දී ආරම්භ කරන ලදී. 2020 වසර අවසානය වන විට, පිළිවෙළින්, සියයට 60ක සහ සියයට 92ක භෞතික ප්‍රගතියක් අත් කර ගනිමින් කොළඹ අගනගරාශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන කැළණිය සහ ආරුවක්කාලු ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථාන ඉදි කිරීමේ කටයුතු 2020 වසරේ දී අඛණ්ඩව සිදු විය. තවද, මීතොටමුල්ල කසල අංගනය 2017 වසරේ දී අසාර්ථක වීමෙන් පසුව ආරම්භ කරන ලද කෙරවලපිටිය අපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘතිය 2020 වසරේ දී අඛණ්ඩව සිදු කරගෙන යන ලදී. මීට අමතරව, 'අපද්‍රව්‍ය සම්පත් බවට පත් කිරීමේ' රජයේ ප්‍රතිපත්තිමය සංකල්පයට සමගාමීව, පෞද්ගලික සමාගමක හවුල්කාරිත්වය සහිතව, 2021 වසර මුල දී, අපද්‍රව්‍ය මගින් බලශක්තිය නිපදවීමේ ශ්‍රී ලංකාවේ පළමු බලාගාරයේ මෙහෙයුම් කටයුතු ආරම්භ විය.


## සමාජ ආරක්ෂණ ජාල වැඩපිළිවෙළ සහ දිළිඳුකම තුරන් කිරීම

**දරිද්‍රතාවය අවම කිරීම සම්බන්ධයෙන් පසුගිය දශක තුන තුළ අත් කරගත් ප්‍රගතිය ඒ අයුරින්ම පවත්වාගෙන යෑම සඳහා කොවිඩ්-19 වසංගතය තුළින් සැලකිය යුතු අභියෝගයක් එල්ල විය හැකිය.** 2016 වසරේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව, ජනගහන දරිද්‍රතා දර්ශකය, 2012/13 දී වාර්තා වූ සියයට 6.7ක සිට 2016 වසරේ දී සියයට 4.1ක් දක්වා අඩු වී ඇත. දරිද්‍රතා රේඛාවට පහළින් සිටින ජනගහනය, 2012/13 සමීක්ෂණ කාලය තුළ වාර්තා වූ මිලියන 1.3ක සිට 2016 වසරේ දී මිලියන 0.8ක් දක්වා අඩු වී ඇති බව ඇස්තමේන්තු කර ඇත. මෙම සමීක්ෂණ කාලපරිච්ඡේද දෙක අතර දරිද්‍රතාවයෙන් පෙළෙන ජනගහනයේ අඩු වීමක් පැවතිය ද, බස්නාහිර පළාතේ වාසය කරන පුද්ගලයන් රටේ අනෙකුත් පළාත්වල ජීවත් වන කාණ්ඩවලට සාපේක්ෂව ආර්ථික වශයෙන් වඩා හොඳ මට්ටමක සිටින අතර, ඒ අනුව පළාත් සහ දිස්ත්‍රික්ක මට්ටමින් දරිද්‍රතාවයෙහි සැලකිය යුතු විෂමතා අඛණ්ඩව පවතින බව 2016 වසරේ සමීක්ෂණ දත්ත මගින් පෙන්නුම් කර ඇත. කොවිඩ්-19 වසංගතය මගින් නාගරික, ග්‍රාමීය සහ වතු ප්‍රදේශ අතර මෙම විෂමතා උග්‍ර කෙරෙනු ඇත. පෙර දී දරිද්‍රතාවය අඛණ්ඩව පහළ මට්ටමක පැවතුණු, විශේෂයෙන්ම, කොළඹ වැනි නාගරික ප්‍රදේශ කිහිපයක, එම ජනාකීර්ණ පෙදෙස්වල කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය වැළැක්වීම පිණිස දීර්ඝතම කාලයක් පුරා සමාජ හා ආර්ථික කටයුතු සීමා කර තැබීම හා සංචරණ සීමා පැනවීමට සිදු වීම හේතුවෙන් නාගරික දරිද්‍රතාවයට ද මෙම වසංගතය මගින් සැලකිය යුතු බලපෑමක් ඇති කෙරෙනු ඇත. රැකියාවේ ස්වභාවය අනුව 'නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කිරීමේ' විකල්පයට අවස්ථාවක් නොමැති හා වසංගතයේ උච්චතම කාල සීමාව තුළ වැටුප් සහිත නිවාඩු හිමි නොවූ, රට පුරා විහිදී සිටින අඩු ආදායම්ලාභී පවුල්වල අවිධිමත් අංශයේ සේවයේ නියුතු, අඩු වැටුප් ලබන්නන්ට කොවිඩ්-19 ව්‍යාප්තිය තුළින් ඉහළ බලපෑමක් ඇති කරන්නට ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකය යථා තත්ත්වයට පත් වුව ද, වසංගතයේ දිගු කාලීන බලපෑම් මෙම ජන කොටස්වල ජීවනෝපායන් කෙරෙහි සෘණාත්මක ලෙස බලපානු ඇත. සේවා නියුක්ත පුද්ගලයන්ගෙන් සියයට 57.4කට ආසන්න පිරිසක් විධිමත් සේවා අංශයෙන් පරිබාහිරව සිටින අතර, මෙවැනි කම්පන හමුවේ එවැනි ජන කොටස්වල සමාජ ආර්ථික සුරක්ෂිතතාව දුර්වල මට්ටමක පවතී.

**කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ, ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබූ කාලපරිච්ඡේදය තුළ සහ ඉන් පසුව ජීවනෝපායන් අහිමි වුණු පවුල් මූල්‍යමය වශයෙන් මුහුණ දුන් දුෂ්කරතා අවම කිරීමට උත්සාහ දරමින් අඩු ආදායම්ලාභී හා අවදානමට ලක්විය හැකි පවුල් ආරක්ෂා කිරීම සඳහා රජය විසින් පියවර කිහිපයක් ගනු ලැබීය.** කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීමත් සමඟ, අඩු ආදායම්ලාභී පවුල්වල දුර්වල

3

**3.13 රූප සටහන**
**දිස්ත්‍රික් මට්ටමේ ජනගහන දරිද්‍රතා දර්ශකය - 2016**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මූල්‍ය තත්ත්වය හඳුනාගත් රජය විසින්, අවදානමට ලක්විය හැකි පවුල් සඳහා පවුලකට රු. 5,000 බැගින් වූ දීමනාවක් අවස්ථා දෙකක දී ලබා දීමට කටයුතු කරන ලදී. මෙම සෑම අවස්ථාවක දී ම දළ වශයෙන් පවුල් මිලියන 5ක් පමණ එම ප්‍රතිලාභය ලබා ගෙන ඇති අතර, රුපියල් බිලියන 25ක් බෙදා දී ඇත. මේ අතර, රජය සහ මහ බැංකුව විසින් මූල්‍ය අංශය සමඟ සමීපව කටයුතු කරමින්, ණය ආපසු ගෙවීමේ දී ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් සඳහා සහන කාලයක් ලබා දීමට, අඩු පොලී අනුපාතික යටතේ කාරක ප්‍රාග්ධනය සැපයීමට සහ පොලී අනුපාතික අඩු කිරීමට අඛණ්ඩව පහසුකම් සලසන ලදී. එවැනි ක්‍රියාමාර්ග ක්ෂණිකව ක්‍රියාත්මක කිරීම මගින් ගෘහ ඒකකවලට දැරීමට සිදු වන මූල්‍යමය දුෂ්කරතා යම්තාක් දුරකට අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, විධිමත් මූල්‍ය වෙළඳපොළ වෙත අවම ප්‍රවේශයක් ඇති අඩු ආදායම්ලාභී හා අවදානමට ලක්විය හැකි ගෘහ ඒකක, මෙම ආර්ථික කම්පනවලින් විෂමානුපාතිකව බලපෑමට ලක් වනු ඇත. දරිද්‍රතාවය තුරන් කිරීමේ නව පියවරක් ලෙස විධිමත් අධ්‍යාපනයක් නොමැති හෝ අ.පො.ස. සාමාන්‍ය පෙළ මට්ටමට වඩා අඩු අධ්‍යාපනයක් ලබා ඇති අතිශය දුප්පත් පවුල්වල නුපුහුණු ශ්‍රමිකයන්ට රැකියා අවස්ථා ලබා දීම ද රජය විසින් ආරම්භ කළේය.

**අඩු ආදායම්ලාභී සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සමාජ ආර්ථික යහපැවැත්ම ඉහළ නැංවීම සඳහා රජය විසින් අඛණ්ඩව වසර පුරා විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.** 2020 වසරේ දී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි සහන වැඩසටහන යටතේ රුපියල් බිලියන 52.5ක මුදලක් ප්‍රතිලාභී පවුල් මිලියන 1.8ක් අතර බෙදා දෙන ලදී. යම්කිසි විශේෂ අවස්ථාවක දී හෝ දුෂ්කර කාලයක දී මූල්‍යමය වශයෙන් සහනයක් ලබා දීම අරමුණු කොටගත් සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ ප්‍රතිලාභී පවුල් 358,343ක් අතරේ රුපියල් බිලියන 1.6ක් බෙදා දෙන ලදී. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සමස්ත සමාජ ආර්ථික යහපැවැත්ම ඉහළ නැංවීම සඳහා සහාය වෙමින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ජීවනෝපාය, ව්‍යවසායකත්ව සහ සමාජ සංවර්ධන වැඩසටහන් කිහිපයක්ම අඛණ්ඩව සිදු කරන ලදී. විවිධ අවහිරතා මධ්‍යයේ වුව ද, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් එම වසර

**3.13 සංඛ්‍යා සටහන**
**ප්‍රධාන සුභසාධන වැඩසටහන් - ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව සහ ප්‍රදානයන්හි වටිනාකම**

| වර්ෂය | දිවිනැගුම / සමෘද්ධි සහනාධාර වැඩසටහන | | පෝෂණ දීමනා වැඩසටහන | | වියළි සලාක වැඩසටහන |
|---|---|---|---|---|---|
| | පවුල් සංඛ්‍යාව (අ) | වටිනාකම (රු. මිලියන) (ආ) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව (අ) | වටිනාකම (රු. මිලියන) (ඇ) | වටිනාකම (රු. මිලියන) |
| 2016 | 1,407,235 | 40,740 | 337,554 | 5,746 | 111 |
| 2017 | 1,388,242 | 39,707 | 372,407 | 5,408 | 84 |
| 2018 | 1,384,021 | 39,239 | 329,047 | 5,490 | 58 |
| 2019 | 1,800,182 | 44,660 | 300,246 | 5,279 | 105 |
| 2020 | 1,770,086 | 52,472 | 238,034 | 4,761 | ලැ.නො. |

(අ) වසර අවසානයේ දී
(ආ) භූමිතෙල් සහනාධාරය ද ඇතුළත්ව
(ඇ) 2020 දත්ත කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය මත පදනම් වන නමුත් 2016 සිට 2019 දක්වා කාල සීමාව තුළ දත්ත මුදල් අමාත්‍යාංශය මත පදනම් වේ.

මූලයන්: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
මුදල් අමාත්‍යාංශය

තුළ දී ගර්භනී සහ කිරි දෙන මව්වරුන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කෙරෙන පෝෂණ දීමනා වැඩසටහන මෙන්ම, විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුල් ඉලක්ක කර ගනිමින් පෙර පාසල් ළමුන් සහ/හෝ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාර ලබා දීමේ වැඩසටහන අඛණ්ඩව සිදු කරන ලදී. දෙවනුව සඳහන් කෙරුණු වැඩසටහන යටතේ, රුපියල් මිලියන 76.5ක පිරිවැයක් දරා ඇති අතර, ආවරණය කරන ලද ළමුන් සංඛ්‍යාව 85,798ක් විය. දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රවර්ධනය කිරීම, කාන්තාවන්ගේ කුසලතා වර්ධනය කිරීම සහ කාන්තාවන්ගේ හා දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා තවත් පියවර කිහිපයක්ම රාජ්‍ය අමාත්‍යාංශය විසින් මෙම වසර තුළ දී ගන්නා ලදී. මේ අතර, ශීඝ්‍රයෙන් ඉහළ යන වැඩිහිටි ජනගහනය ඉදිරි වසරවල දී දරිද්‍රතාවයට සැලකිය යුතු බලපෑමක් සිදු කිරීමට ඉඩ ඇත. ශ්‍රම බලකායෙන් සැලකිය යුතු කොටසක් විධිමත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඔස්සේ ප්‍රතිලාභ නොලැබෙන, අවිධිමත් සහ පෞද්ගලික යන දෙ අංශයේ සේවය කරන බැවින්, අනාගත විශ්‍රාමිකයින්ට සහාය වීම සඳහා රට පුරා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් පිහිටුවීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. එවැනි විශ්‍රාම ක්‍රමයක් නොමැති විට, අපේක්ෂිත ආයු කාලය අඛණ්ඩව ඉහළ යන පසුබිමක් තුළ, ඉදිරි වසර කිහිපය තුළ දී රාජ්‍ය මූල්‍ය වෙත සැලකිය යුතු බලපෑමක් ඇති කරමින්, අනාගතයේ දී විශ්‍රාමිකයන් රජයේ වෙනත් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම වෙත යොමු වනු ඇත. එවැනි තත්ත්වයක් තුළ, රජයේ මූල්‍යාධාර හා දරිද්‍රතාවය දුරු කිරීමේ වැඩසටහන් සඳහා ප්‍රතිලාභ ලැබිය යුත්තන් හඳුනා ගැනීම, එම වැඩසටහන් සඳහා පුද්ගලයන් ඇතුළත් කිරීම හා ඉවත් කිරීම ආදී ක්‍රියා පටිපාටිවල ඇති වියවුල්කාරී බව වැනි දැනට පවතින ගැටලු තවදුරටත් තීව්‍ර වනු ඇති අතර, ඒ හේතුවෙන් එම වැඩසටහන්වල ඉලක්කකරණය අකාර්යක්ෂම වනු ඇත.

## පරිසරය

**තිරසාර වර්ධනයක් සහතික කිරීම සහ එමගින් සාර්ව ආර්ථික ස්ථායිතාව ඇති කිරීම සඳහා ආර්ථික වර්ධනය සහ පරිසරය සංරක්ෂණය අතර සමතුලිතතාවක් ඇති කිරීම අත්‍යවශ්‍ය වේ.** තිරසාර නොවන වේගයකින් සම්පත් පරිභෝජනය කිරීමේ සහ පාරිසරික බලපෑම් අවම කිරීමේ පියවර පිළිබඳව සලකා බැලීමකින් තොරව අත්කරගනු ලබන ආර්ථික වර්ධනය තුළින් වනාන්තර, ජල මූලාශ්‍ර සහ පස වැනි ස්වාභාවික සම්පත් ක්ෂය වීමට හා හායනයට ලක්වීම සිදු විය හැකි අතර, එය අපද්‍රව්‍ය එක්රැස් වීමටත් එමගින් පරිසර දූෂණය ඇති වීමටත් හේතු විය හැකිය. එමෙන්ම, මෙම තත්ත්වයන්ගේ අවසාන ප්‍රතිඵලය ලෙස දේශගුණික විපර්යාසයන්ට මුහුණ දීමට සිදු විය හැකිය. විශේෂයෙන්ම, මෙරට පාරිසරික සංචාරක කර්මාන්තය සුවිශේෂී අංගයක් ලෙස වර්ධනය වීම සැලකිල්ලට ගත් කළ, මෙමගින් සංචාරක කර්මාන්තය ආශ්‍රිත කටයුතුවලට මෙන්ම, කෘෂිකාර්මික ඵලදායිතාව සහ බලශක්ති උත්පාදනය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරන බව සඳහන් කල යුතු නොවේ. 2019 වසරේ ගෝලීය දේශගුණික අවදානම් දර්ශකයට අනුව, රටවල් 180ක් අතරින් ශ්‍රී ලංකාව අවදානම වැඩි රටවල් අතර 30 වැනි ස්ථානයට පත් වී ඇති අතර, 2000-2019 කාලසීමාව තුළ මෙරට ක්‍රියාකාරිත්වය සලකා බැලීමේ දී රටවල් 180කින් 23 වැනි ස්ථානයට පත්ව ඇත. දර්ශකයේ වඩාත්ම බලපෑමට ලක්වූ රටවල් 10 කාණ්ඩයෙන් රට ඉවත් වී තිබුණ ද, දේශගුණික විපර්යාස හා සම්බන්ධ අවදානම් තවදුරටත් දිගු කාලීනව බලපෑම් ඇති කරමින් පවතින බව ශ්‍රී ලංකාව මුහුණදෙන නියං සහ ගංවතුර තත්ත්ව මගින් පෙන්නුම් කෙරේ. දේශගුණික විපර්යාස මගින් ආර්ථික ක්‍රියාකාරිත්වය, මානව ජනගහනය සහ පරිසර පද්ධති මත ඇති කෙරෙන බලපෑම ආපසු හැරවීමට නොහැකි විය හැකි අතර, සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වයේ ස්වභාවය වෙනස් කිරීමට හේතු විය හැකි බැවින්, එයින් පද්ධතිමය බලපෑමක් ඇති විය හැකිය. මේ පිළිබඳව නිසි අවධානයක් යොමු කරමින්, රටේ සංවර්ධන ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය තුළ වගකීමෙන් යුතුව සම්පත් පරිභෝජනය, පාරිසරික සංරක්ෂණ ක්‍රියාමාර්ග සහ දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීමේ උපාය මාර්ග කෙරෙහි ප්‍රතිපත්ති සම්පාදකයින් සහ අදාළ පාර්ශ්වකරුවන් විසින් විශේෂ ප්‍රමුඛතාවක් ලබා දීම අත්‍යවශ්‍ය වේ.

**මධ්‍යම පරිසර අධිකාරිය 2020 වසරේ දී පරිසර දූෂණය පාලනය කිරීම හා අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු හා සම්බන්ධව අඛණ්ඩව කටයුතු කළේය.** පරිසර දූෂණය පාලනය කිරීම සඳහා කාර්මික ක්‍රියාකාරකම් නියාමනය කිරීමට අමතරව, කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම හරහා පරිසර දූෂණය වැළැක්වීම, අපද්‍රව්‍ය අවම කිරීම සහ කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන කටයුතු පරිසර හානි අවම කරන අන්දමින් සිදු කිරීම දිරිමත් කරන අතරම, පාරිසරික ප්‍රමිති හා අනුකූල වීම සහතික කිරීම සඳහා ද මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු කළේය. ඒ අනුව, වසර තුළ දී, කාර්මික ක්‍රියාකාරකම් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර 1,242ක් නිකුත් කර ඇති අතර, ආයෝජන මණ්ඩල කලාප සඳහා පරිසර

ආරක්ෂණ බලපත්‍ර 3ක් නිකුත් කර ඇත. තවද, වසර තුළ දී මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ සහතික දෙකක් සහ මූලික පාරිසරික බලපෑම් ඇගයීමේ සහතික 98ක් නිකුත් කරන ලදී. විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ, තැපැල් දෙපාර්තමේන්තුවෙහි සහාය ද ඇතිව, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ගෘහ ඒකකවලින් මෙට්‍රික් ටොන් 77.5ක පමණ විද්‍යුත් අපද්‍රව්‍ය එක්රැස් කර, විද්‍යුත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් වෙත එම අපද්‍රව්‍ය තොග භාර දීමට කටයුතු කරන ලදී. මේ අතර, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ පාරිසරික සම්පත් කළමනාකරණය සඳහා භූමිය සම්බන්ධයෙන් මංගත දත්ත පද්ධතියක් සකස් කරන ලද අතර, වනජීවී රක්ෂිත ප්‍රදේශ සහ රක්ෂිත වනාන්තරවල දත්ත යාවත්කාලීන කරන ලදී.

3

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2020 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද 2015 වන ආවරණ ඇගයීම් වාර්තාවට අනුව, ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත මුළු වන ආවරණය හෙක්ටයාර 1,865,671ක් වන අතර, එයින් රටේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 28.4ක් නිරූපණය වේ.** මීට පෙර 2010 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද වන ආවරණ ඇගයීම් වාර්තාවට අනුව, ඇස්තමේන්තුගත වන ආවරණය සමස්ත ඉඩම් ප්‍රමාණයෙන් සියයට 29.7ක් විය. මීළඟ වාර්තාව එළි දක්වන තෙක් වාර්ෂිකව නැවත වන වගා කරන ලද ඉඩම් ප්‍රමාණය හා වනහරණයට ලක්වන ඉඩම් ප්‍රමාණය පිළිබඳව තොරතුරු වනාන්තර ආවරණ ඇස්තමේන්තු සැකසීමේ දී ගැලපුම් නොකරන බැවින්, දැනට පවතින වනාන්තර ආවරණ ඇස්තමේන්තුව මගින් රටේ වන සම්පත් සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳ යාවත්කාලීන වූ තොරතුරක් ලබා නොදෙයි. එබැවින්, නව ඩිජිටල් අවකාශ තාක්ෂණය හරහා එක්රැස් කරන යාවත්කාලීන තොරතුරු සමඟ අනවසර හා පාරිසරික වශයෙන් තිරසාර නොවන වනාන්තර විනාශය හඳුනා ගැනීම සඳහා මෙන්ම, වන ආවරණය පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වා ගැනීම ශ්‍රී ලංකාව විසින් සිදු කළ යුතුව ඇත.

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පූර්ව අනතුරු ඇඟවීම් ලබා දීමට සහ රටේ ආපදා තත්ත්වයන් සඳහා සූදානම මෙන්ම, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම වැඩි දියුණු කිරීම සඳහා පියවර ගණනාවක් ගනු ලැබීය.** 2020 වසර තුළ දී, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පෙර සූදානම් කටයුතුවලට පහසුකම් සැලසීම සහ ස්වාභාවික ආපදා අවදානම අවම කිරීම සඳහා සාමාන්‍ය ජනතාව, අදාළ ආපදා කළමනාකරණ බලධාරීන් සහ ධීවර ප්‍රජාව ඉලක්ක කරමින් කාලගුණ අනාවැකි 5,718ක් සහ අනතුරු ඇඟවීම් සහ නිවේදන 513ක් නිකුත් කරන ලදී. මීට අමතරව, 2020 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළෙහි ගිනි ගැනීමට ලක් වූ නිව් ඩයමන්ඩ් නෞකාවෙන් කාන්දු විය හැකි තෙල් ගලා යාමේ දිශානතිය සහ තෙල් කාන්දුවෙන් හානි විය හැකි ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා එම තෙල් පාවී යතැයි උපකල්පිත ගලා යාමේ රටාව පිළිබඳ නිවේදන තුනක්, ඉන්දියානු සාගර තොරතුරු සේවා මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී. 2020 වසර තුළ දී මුහුණ දුන් අම්ෆන් සහ බුරවි යන නිවර්තන සුළි සුළං තත්ත්වවල දී, ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ගම් මට්ටමින් ආපදා සඳහා සූදානම් වීම සහ පශ්චාත් ආපදා ප්‍රතිචාර කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු සිදු කළේය. මේ අතර, ප්‍රමුඛතාව අනුව තෝරාගත් අවදානම් සහගත බෑවුම් සහ නායයෑම් සිදුවිය හැකි ස්ථාන තුනක ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීමේ පියවර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ක්‍රියාත්මක කරන ලදී. 2020 වසරේ දී, නායයෑම් පිළිබඳ සඵලදායී පූර්ව අනතුරු ඇඟවීම් සඳහා වර්ෂාපතනය අධීක්ෂණය කිරීම සහ තත්කාලීන දත්ත ලබා ගැනීම පිණිස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් එහි ස්වයංක්‍රීය වර්ෂාමාන ජාලය, නායයෑමේ අවදානමට ලක් විය හැකි දිස්ත්‍රික්ක 14ක් පුරා පැතිරුණු වර්ෂාමාන 300ක් දක්වා පුළුල් කරන ලදී.